ශ්‍රී ලංකා නාවික හමුදාව
இலங்கை கடற்படை
SRI LANKA NAVY

2025



වාර්ෂික කාර්යසාධන වාර්තාව
வருடாந்த செயலாற்றுகை அறிக்கை
ANNUAL PERFORMANCE REPORT

2025 වසර සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව



2025 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

ශ්‍රී ලංකා නාවික හමුදාව

වැය ශීර්ෂය 223

අන්තර්ගතය	පිටු අංකය
පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය	3-8
පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම	9-29
පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය	30-37
පරිච්ඡේදය 04 - කාර්යසාධන දර්ශක	38-40
පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය	41-46
පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ	47
පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව	48-54

01 පරිච්ඡේදය
ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

ඉන්දියන් සාගරයේ මුහුදු මාර්ගයට මැදිව පිහිටා ඇති ශ්‍රී ලංකාව අතීතයේ සිටම නාවිකයින්ගේ නිබඳ අවධානයට යොමු වූ දිවයිනක් විය. ඒ අනුව පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසි ජාතිකයින් විසින් කාලයෙන් කාලයට අප දිවයින ඔවුන්ගේ පාලනයට නතු කරගන්නා ලදී. සියවසකට අධික කාලයක් ශ්‍රී ලංකාව පාලනය කළ ඉංග්‍රීසි ජාතිකයින් විසින් නාවික හමුදාවක අවශ්‍යතාව සපුරා ගැනීම සඳහා 1937 වර්ෂයේ දී ලංකා නාවික ස්වේච්ඡා බලකාය (Ceylon Naval Volunteer Force) ආරම්භ කරන ලදී. දෙවන ලෝක යුද්ධය අවසානයත් සමඟම රාජකීය නාවික හමුදාව විසින් ලංකා නාවික ස්වේච්ඡා බලකාය බ්‍රිතාන්‍ය නාවික හමුදාව යටතට පවරාගන්නා ලද අතර, එතැන් පටන් එය ලංකා රාජකීය නාවික ස්වේච්ඡා උපසේවය (Ceylon Royal Naval Volunteer Reserve) ලෙස හඳුන්වා දෙන ලදී. 1948 පෙබරවාරි 04 වන දින බ්‍රිතාන්‍ය යටත් විජිතයෙන් නිදහස ලබා ගැනීමත් සමඟින් ශ්‍රී ලංකාවට ස්ථිර නාවික හමුදාවක් පිහිටුවීමේ අවශ්‍යතාව ඉස්මතු විය. ඒ අනුව 1950 දෙසැම්බර් 09 වන දින අංක 34 දරන නාවික පනත නීතිගත කළ අතර, එමඟින් ලංකා රාජකීය නාවික හමුදාව (Ceylon Royal Navy) පිහිටුවන ලදී. 1972 වර්ෂයේදී හඳුන්වා දුන් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවත් සමඟම ලංකා රාජකීය නාවික හමුදාව (Ceylon Royal Navy) යන නම ඉවත් කර, ඒ වෙනුවට ශ්‍රී ලංකා නාවික හමුදාව (Sri Lanka Navy) ලෙස නාමය වෙනස් කරන ලදී. මෙවන් ඉතිහාසයකට හිමිකම් ලබන ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් රටට අයත් මුහුදු සීමාව තුළ හා ඊට ඔබ්බෙන් වූ මුහුදේ පවා රටේ ස්වෛරීභාවය සහ භෞමික අඛණ්ඩතාව ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය මෙහෙයුම් සිදු කරමින්, වෙරළ තීරය හා රට අභ්‍යන්තරයේ නීතිය හා සාමය ආරක්ෂා කරමින් රට සෞභාග්‍යමත් කිරීමට සිදු කරන කාර්යයන් සඳහා තම උපරිම දායකත්වය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත ලබා දෙනු ලබයි.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර සහ අරමුණු

ශ්‍රී ලංකා නාවික හමුදාව රටේ ජාතික අවශ්‍යතා ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාව අවට මුහුදු තීරයේ මෙන්ම ගොඩබිමේද ක්‍රියාත්මක වේ. මෙහෙයුම් අවශ්‍යතා, වෙනත් හදිසි අවස්ථාවල දී නීතිය හා සාමය පවත්වා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ අනෙකුත් හමුදාවන්ට සහ ශ්‍රී ලංකා පොලීසියට සහාය ලබා දීමෙන් මෑත අතීතයේ දී නාවික හමුදාවේ ගොඩබිම් මෙහෙයුම් හැකියාව ද විශාල ලෙස වැඩිදියුණු විය.

1.2.1 දැක්ම

ශ්‍රී ලංකාවට අයත් සාගරික සම්පත් ආරක්ෂා කරමින් එහි ජාතික ආරක්ෂාව තහවුරු කරනු වස් නොගැඹුරු සහ ගැඹුරු දියඹෙහිද අභියෝගයන්ට මුහුණ දිය හැකි ශක්තිමත් නාවික හමුදාවක් ලෙස වර්ධනය වීම.

1.2.2 මෙහෙවර

ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂාව තහවුරු කිරීම පිණිස අවශ්‍ය අවි, උපකරණ සහිතව නිසි පුහුණුව ලබමින්, සාගරික සම්පත් ආරක්ෂා කරමින් මහ මුහුදේ ආධිපත්‍යය රැකගත හැකි නාවික හමුදාවක් බවට පත්වීම.

1.2.3 අරමුණු

අ. නාවික හමුදාමය කටයුතු.

(1) ශ්‍රී ලංකාවේ සමුද්‍රීය ආරක්ෂාව සුරක්ෂිත කිරීම තුළින් ස්වෛරී සහ භෞමික අඛණ්ඩතාව ආරක්ෂා කිරීම.
(2) යුදමය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මෙහෙයුම් සිදු කිරීම සහ ස්වකීය හමුදාවන්ට ආධාර කිරීම සඳහා නාවික සහාය ලබා දීම.
(3) මුහුදු සන්නිවේදන මාර්ග (SLOC) පවත්වා ගෙන යන අතර, අවශ්‍ය විටෙක ආරක්ෂක අංශ සඳහා සැපයුම් සහය සහ මුහුදු ගමන් සැපයීම.
(4) නැව් නඩත්තු කිරීම, අලුත්වැඩියා කිරීම සහ ඉදිකිරීම.
(5) ගොඩබිම් මෙහෙයුම් සහ ගොඩබිම් ආරක්ෂාව.
(6) නාවික පුද්ගලයින් පුහුණු කිරීම.
(7) සාමය බලාත්මක කිරීමේ මෙහෙයුම් සිදු කිරීම.
(8) බුද්ධි තොරතුරු රැස් කිරීම සහ නිරීක්ෂණය.

ආ. **<u>රාජ්‍ය තාන්ත්‍රික කටයුතු.</u>**

(1) ස්වභාවික විපත් වලදී ආධාර සැපයීම.
(2) සමුද්‍රීය කුසලතා රජයට සහ වෙනත් සංවිධානවලට ලබා දීම.
(3) සම්භාවනීය අමුත්තන්ට සහ අනෙකුත් පුද්ගලයින්ට මුහුදු ගමන් මාර්ගය සැපයීම.
(4) කිමිදුම් සහ ගැලවීමේ මෙහෙයුම් සිදු කිරීම.
(5) විද්‍යාත්මක හා සාගර දත්ත රැස් කිරීම.
(6) විදේශ ජාතීන්ට සහාය වීම.
(7) සාම සාධක මෙහෙයුම් සිදු කිරීම.

ඇ. **<u>නීතිය බලාත්මක කිරීමේ කටයුතු.</u>**

(1) අවි ජාවාරම සහ මත්ද්‍රව්‍ය ජාවාරම වැළැක්වීම.
(2) නීති විරෝධී සංක්‍රමණිකයින් වැළැක්වීම/ රට තුළට සංක්‍රමණය වීම වැළැක්වීම.
(3) මුහුදේ නිරීක්ෂණ කටයුතු සහ මුදාගැනීමේ (SAR) මෙහෙයුම් සිදු කිරීම.
(4) මසුන් ඇල්ලීම සහ අනවසර මුලද්‍රව්‍ය මඟින් සමුද්‍ර සම්පත් ගවේෂණය කිරීම හා සුරාකෑම වැළැක්වීම සඳහා අධීක්ෂණය.
(5) ශ්‍රී ලංකා මුහුදේ අනවසර මසුන් ඇල්ලීම වැළැක්වීම.
(6) සිවිල් බලයට ආධාර කිරීම.
(7) නීති විරෝධී ජාවාරම් වැළැක්වීම.
(8) ත්‍රස්තවාදී ප්‍රහාර, කඩාකප්පල්කාරී ප්‍රහාර, මුහුදු කොල්ලකෑම්වලට එරෙහිව සියලු වරායන් සඳහා ආරක්ෂාව සැපයීම.
(9) ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් සඳහා ශ්‍රී ලංකාවේ මුහුදු තීරය භාවිත කිරීම වැළැක්වීම.
(10) සමුද්‍රීය පරිසරය සංරක්ෂණය සහ ආරක්ෂා කිරීම.
(11) අක්වෙරළ වත්කම් ආරක්ෂා කිරීම.
(12) කැරලි මර්දන මෙහෙයුම් සඳහා සහාය වීම.
(13) නාවික නොවන පුද්ගලයින් පුහුණු කිරීම.

1.3 **<u>ප්‍රධාන කාර්යයන්</u>**


අ. ආරක්ෂක සේනාවන්හි එක් විශේෂ යුද සේනාංකයක් ලෙස ශ්‍රී ලංකා නාවික හමුදාව නම් කළ හැක. මෙහි ප්‍රාථමික කාර්යභාරය වනුයේ විශේෂයෙන්ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රතිපත්තීන්ට අනුව රටට අයත් මුහුදු සීමාව තුළ හා ඊට ඔබ්බෙන් රටේ ස්වෛරීභාවය සහ භෞමික අඛණ්ඩතාවය ආරක්ෂා කිරීම සඳහා ඊට එරෙහිව හට ගන්නා මොනයම් හෝ තර්ජනයන්ගෙන් රට ආරක්ෂා කිරීමත්, ගැඹුරු මුහුදේ, වෙරළ තීරය හා රට අභ්‍යන්තරයේ දී නීතිය හා සාමය ආරක්ෂා කරමින් රට සෞභාග්‍යමත් කිරීමට සිදු කරන කාර්යන් සඳහා දායක වීමත්ය. නාවික හමුදාව මඟින් ආරක්ෂා කරන කලාපයන් වශයෙන් මුහුදුකරය, දේශීය ජලතීරය, යාබද කලාප සහ විශේෂිත ආර්ථික කලාපයන් නම් කර ඇති අතර, ඒ ඒ කලාපයන්ට අදාළව පවරා ඇති රාජකාරීන් සාමකාමී හා ගැටුම්කාරී වාතාවරණයන් තුළ එක ලෙස ඉටු කිරීමට නාවික හමුදාව බැඳී සිටියි.

ආ. තවද, විශේෂයෙන් ඇතිවිය හැකි අභ්‍යන්තර ගැටුම් වැනි ගැටලුකාරී අවස්ථාවන්හි දී අනෙකුත් ආරක්ෂක සේවා සමඟ එක්වී ගොඩබිම් මෙහෙයුම් දියත්කර රටේ නීතිය හා සාමය ආරක්ෂා කිරීමේ කර්තව්‍යන්හි නිරත වීම ද්විතීයික කාර්යය ලෙස හැඳින්වේ.

ඇ. තවද, රාජ්‍ය ආයතනයන්හි පරිපාලන කටයුතු සඳහා සහාය වීම, විශේෂයෙන්ම සංවර්ධන වැඩපිළිවෙල උදෙසා සමුද්‍රීය ක්‍රියාකාරකම්වල යෙදී සිටින ආයතන සඳහා සහයෝගය ලබා දීම හා වෙරළ හා සමුද්‍රීය ආරක්ෂණය නාවික හමුදාවේ තෘතීය කාර්යය ලෙස හැඳින්විය හැක.

1.4

නාවික හමුදා සංවිධාන සටහන



1.5 රටට අයත් මුහුදු තීරය ඵලදායි ලෙස පරිපාලනය සහ ආරක්ෂා කිරීමත්, පැවරෙන රාජකාරීන් කාර්යක්ෂමව ඉටුකිරීමත් සඳහා සමස්ත දිවයිනම ආවරණය වන අයුරින් පහත සඳහන් පරිදි නාවික විධාන 07කට බෙදා වෙන්කර පරිපාලන කටයුතු සිදු කරනු ලබයි.

අ.	බටහිර නාවික විධානය	-	ආඥාපති බටහිර නාවික පෙදෙස විසින් අණදෙනු ලබයි
ආ.	නැගෙනහිර නාවික විධානය	-	ආඥාපති නැගෙනහිර නාවික පෙදෙස විසින් අණදෙනු ලබයි
ඇ.	උතුරු නාවික විධානය	-	ආඥාපති උතුරු නාවික පෙදෙස විසින් අණදෙනු ලබයි
ඈ.	උතුරු මැද නාවික විධානය	-	ආඥාපති උතුරු මැද නාවික පෙදෙස විසින් අණදෙනු ලබයි
ඉ.	දකුණු නාවික විධානය	-	ආඥාපති දකුණු නාවික පෙදෙස විසින් අණදෙනු ලබයි
ඊ.	වයඹ නාවික විධානය	-	ආඥාපති වයඹ නාවික පෙදෙස විසින් අණදෙනු ලබයි
උ.	ගිණිකොන නාවික විධානය	-	ආඥාපති ගිණිකොන නාවික පෙදෙස විසින් අණදෙනු ලබයි

1.6 ශ්‍රී ලංකා නාවික හමුදාවේ ඇති ඒ ඒ නාවික විධානයන්ට අයත් ගොඩබිම් ආයතන පහත පරිදි වේ.

අ.	බටහිර නාවික විධානය	ශ්‍රීලංනානෞ ලංකා ශ්‍රීලංනානෞ ගැමුණු ශ්‍රීලංනානෞ මහසෙන් ශ්‍රීලංනානෞ රංගල ශ්‍රීලංනානෞ තක්ෂිලා ශ්‍රීලංනානෞ පරාක්‍රම නාවික මහ රෝහල (කොළඹ) ශ්‍රීලංනානෞ ශිල්ප ශ්‍රීලංනානෞ කැළණි නාවික අනුකණ්ඩය කොළඹ නාවික අනුකණ්ඩය අකුරේගොඩ
ආ.	නැගෙනහිර නාවික විධානය	නාවික හා සාගරික විද්‍යාපීඨය ශ්‍රීලංනානෞ විදුර 4 වන වේග ප්‍රහාරක යාත්‍රා සමූහය ශ්‍රීලංනා තඨාකාංගණය ශ්‍රීලංනානෞ විජයබා ශ්‍රීලංනානෞ කාශ්‍යප ශ්‍රීලංනානෞ රන්වැලි ශ්‍රීලංනානෞ තිස්ස ශ්‍රීලංනානෞ මහවැලි ශ්‍රීලංනානෞ පැරකුම්බා ශ්‍රීලංනානෞ ගෝඨාභය විශේෂ යාත්‍රා බලඝණ මූලස්ථානය ශ්‍රීලංනානෞ ගෝකණ්ණ ශ්‍රීලංනානෞ වළගම්බා ශ්‍රීලංනානෞ ලංකාපටුන

ඇ.	උතුරු නාවික විධානය	ශ්‍රීලංනානෞ වේළුසුමන ශ්‍රීලංනානෞ කංචදේව ශ්‍රීලංනානෞ උත්තර ශ්‍රීලංනානෞ එළාර ශ්‍රීලංනානෞ අග්බෝ ශ්‍රීලංනානෞ වසභ ශ්‍රීලංනානෞ ගෝඨයිම්බර නාවික ස්ථානගත කිරීම වෙත්තලකේණි
ඈ.	උතුරු මැද නාවික විධානය	ශ්‍රීලංනානෞ ශික්ෂා ශ්‍රීලංනානෞ පණ්ඩුකාභය ශ්‍රීලංනානෞ තම්මැන්නා ශ්‍රීලංනානෞ ගජබා ශ්‍රීලංනානෞ පුස්සදේව ශ්‍රීලංනානෞ බුවනෙක
ඉ.	දකුණු නාවික විධානය	ශ්‍රීලංනානෞ දක්ෂිණ ශ්‍රීලංනානෞ නිපුණ ශ්‍රීලංනානෞ කාවන්තිස්ස ශ්‍රීලංනානෞ රුහුණ
ඊ.	වයඹ නාවික විධානය	ශ්‍රීලංනානෞ විජය ශ්‍රීලංනානෞ තම්බපණ්නි ශ්‍රීලංනානෞ හරණ ක්ෂණික ක්‍රියාකාරී යාත්‍රා බලඝණ මූලස්ථානය ශ්‍රීලංනානෞ ථේරපුත්ත නාවික ස්ථානගත කිරීම මහව
උ.	ගිණිකොන නාවික විධානය	ශ්‍රීලංනානෞ මහානාග ශ්‍රීලංනානෞ දීඝායු

ඌ. ශ්‍රී ලංකා නාවික හමුදාව තුළ ඇති නෞකා සහ යාත්‍රාවන්

(1)	අක්වෙරළ නිරීක්ෂණ නෞකා	-	08
(2)	වේග මිසයිල ප්‍රහාරක නෞකා	-	02
(3)	වේග ප්‍රහාරක නෞකා	-	09
(4)	වෙරළාරක්ෂක මුර නෞකා	-	02
(5)	වේග ප්‍රහාරක මුර යාත්‍රා	-	47
(6)	වේග මගී ප්‍රවාහන යාත්‍රා	-	02
(7)	ගොඩබිමට යාහැකි භාණ්ඩ ප්‍රවාහන නෞකා	-	01
(8)	ගොඩබිමට යාහැකි මධ්‍යම ප්‍රමාණයේ යාත්‍රා	-	02
(9)	ගොඩබිමට යාමට උපයෝගි කර ගන්නා යාත්‍රා	-	05
(10)	සහායක යාත්‍රා	-	01
(11)	වෙරළ ආරක්ෂක මුර යාත්‍රා	-	04
(12)	වෙරළ ආරක්ෂක මුර යාත්‍රා (වෙරළ ආරක්ෂක)	-	67
(13)	වෙරළාසන්න මුර යාත්‍රා	-	35
(14)	කලපු ආශ්‍රිත යාත්‍රා	-	21
(15)	ටග් යාත්‍රා	-	04
(16)	සෙඩ්රික් යාත්‍රා	-	108
(17)	ට්‍රොලර් සහ වල්ලම්	-	30
(18)	ඩිංගි යාත්‍රා	-	295

1.7 විදේශ අරමුදල් සහිත ව්‍යාපෘති පිළිබඳ විස්තර

අ. පාවෙන තඨාකාංගණය (ටොන් 4000) තැනීම

ඉන්දියානු රජය මඟින් ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත පාවෙන තඨාකාංණයක් ප්‍රදානයක් වශයෙන් ලබා දීම සඳහා අවශ්‍ය ගිවිසුම් අත්සන් කර ඇත. මේ වන විට Goa Shipyard ආයතනය එය නිපදවීමේ කටයුතු ආරම්භ කර ඇති අතර, 2025 වර්ෂයේදි එම ව්‍යාපෘතියෙහි 80.9% ප්‍රගතියක් අවසන් කර ඇත. එම පාවෙන තඨාකාංගණය 2026 වසරේ හතරවන කාර්තුව තුළ දී ශ්‍රී ලංකාව වෙත ලබා දීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවති.

ආ. ඇමෙරිකානු වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවට අයත් අඩි 210ක් දිග නෞකාව ලබා ගැනීම

ඇමෙරිකානු වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවට අයත් අඩි 210ක් දිග (Ex USCG DESICIVE) නෞකාව ඇමෙරිකානු රජයේ ආධාරයක් වශයෙන් ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත ලබා ගැනීමට කටයුතු ආරම්භ කර ඇති අතර, අත්පත් කර ගැනීමේ වියදම වශයෙන් ඇ.ඩො.මි 10ක මුදලක් ඇස්තමේන්තු කර ඇති අතර, ශ්‍රී ලංකා රජයට ඉන් ඇ.ඩො.මි 01ක වියදමක් දැරීමට සිදු වේ. නෞකාව ලබා ගැනීම සඳහා වූ ගිවිසුම් අත්සන් කර ඇමෙරිකානු ඩොලර් මිලියන 01ක මුදලක් 2024 සැප්තැම්බර් මස 12 වන දින ගෙවීම් සිදු කරන ලදි. නෞකාවේ කාර්ය මණ්ඩලය ලෙස, නිලධාරීන් 14ක් සහ නාවිකයින් 72 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් 2025 නොවැම්බර් මස 25 වන දින නෞකාවට අනුයුක්ත කර ඇත.

ඇ. ඇමෙරිකා එක්සත් ජනපදය සහ ශ්‍රී ලංකා රජය අතර පසු තාක්ෂණික සහය ගිවිසුම

ඇමෙරිකා එක්සත් ජනපදයෙන් ලබා දුන් නෞකාවන්හි නඩත්තු කටයුතු සහ තාක්ෂණික සේවා සඳහා ඩොලර් මිලියන 2.153 වටිනාකමකින් යුත් FOTS නැමති ගිවිසුමක් ශ්‍රී ලංකා හා ඇමෙරිකානු රජයන් අතර 2025 අප්‍රේල් මස 26 වන දින අත්සන් කරන ලදී. මෙම මුදල් ප්‍රමාණය වියදම් කිරීමෙන් අනතුරුව අවුරුදු පතා ශ්‍රී ලංකා රජය මඟින් ඇමෙරිකානු ඩොලර් මිලියන 0.5ක් ලබාදීම වෙනුවෙන් ගිවිසුමක් සඳහාද යොජනාවක් ඉදිරිපත් කර ඇත.

02 පරිච්ඡේදය
ප්‍රගතිය හා ඉදිරි දැක්ම


2.1 2025 වර්ෂයට අදාළ ප්‍රගතිය

2.1.1 ජාතික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා වන උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම

අ. නාවික හමුදා ප්‍රතිපත්තිවලට අනුව ජාතික ආරක්ෂාවට තර්ජනයක් වන ක්‍රියා, නීති විරෝධී අවි ජාවාරම්, නීති විරෝධී මත්ද්‍රව්‍ය ජාවාරම්, නීති විරෝධී සංක්‍රමණිකයින් රට තුළට ඇතුළුවීම්, රේගු නීති උල්ලංඝනය කිරීම්, නීති විරෝධී මසුන් මැරීම හා සාගරය දූෂණය කිරීම් වැනි ක්‍රියාකාරකම් මැඩලීම සඳහා දේශීය සහ විදේශීය බුද්ධි අංශ සමඟ සම්බන්ධීකරණය වී කටයුතු කරන ලදි.

ආ. Firewall, IDS/IPS, Web Filtering, Anti-Malware සහ Endpoint Security පද්ධති නිසි ලෙස වින්‍යාසගත කර ක්‍රියාත්මක කිරීම, Firewall නීති සහ ආරක්ෂණ ප්‍රතිපත්ති නිතර සමාලෝචනය කර යාවත්කාලීන කිරීම, අනුමැතිය නොමැති ප්‍රවේශයන් වැළැක්වීම සඳහා Network Segmentation ක්‍රියාත්මක කිරීමට කටයුතු සිදු කරන ලදි.

2.1.2. නාවික හමුදා පුද්ගලයින්හට වැටුප් හා දීමනා ගෙවීම



මූලික වැටුප - නිත්‍ය	රු.	18,958,270,122.50
මූලික වැටුප - ස්වේච්ඡා	රු.	5,879,650,983.00
අනෙකුත් දීමනා - නිත්‍ය	රු.	18,134,018,081.51
අනෙකුත් දීමනා - ස්වේච්ඡා	රු.	6,088,624,176.03
එකතුව	**රු.**	**49,060,563,363.04**

2.1.3 නාවික හමුදා පුද්ගලයින්හට උසස්වීම් ලබා දීම

අ. නිලධාරීන්

අනු අංකය	උසස් කරන ලද නිලය	උසස් කරන ලද ගණන
1	අද්මිරාල්	-
2	වයිස් අද්මිරාල්	-
3	රියර් අද්මිරාල්	11
4	කොමදෝරු	22
5	කපිතාන්	27
6	කොමාණ්ඩර්	65
7	ලුතිනන් කොමාණ්ඩර්	98
8	ලුතිනන්	83
9	උප ලුතිනන්	132
10	වැඩ බලන උප ලුතිනන්	97
11	මධ්‍ය නිලධාරී	106
එකතුව		**641**

ආ. <u>නාවිකයින්</u>

අනු අංකය	උසස් කරන ලද තරාතිරම	උසස් කරන ලද ගණන
1	පාලක ප්‍රධාන සුළු නිලධාරී	260
2	සමූහ ප්‍රධාන සුළු නිලධාරී	394
3	ප්‍රධාන සුළු නිලධාරී	552
4	සුළු නිලධාරී	591
5	නායක නැවි	720
6	බල නැවි	1105
7	සාමාන්‍ය නැවි	768
එකතුව		**4390**

2.1.4 <u>නාවික හමුදා පුද්ගලයින්හට පදක්කම් පිරිනැමීම</u>

අනු අංකය	පදක්කම	නාවික පුද්ගලයින් ගණන
1	ශ්‍රී ලංකා සන්නද්ධ සේවා දීර්ඝ සේවා පදක්කම	1016
2	ප්‍රසංසනීය සේවා විභූෂණය සහ ප්‍රසංසනීය සේවා පදක්කම	58
3	උත්තම සේවා පදක්කම	363
4	නාවික හමුදාධිපතිගේ ප්‍රශංසාත්මක පළඳනාව	443
5	ජාතික ආරක්ෂක විද්‍යාලයීය පාඨමාලාව සඳහා වූ පළඳනාව	07
6	මුහුදු සංග්‍රාමික පළඳනාව	652
7	මුහුදු විධාන පළඳනාව	09
8	4 වන වේග ප්‍රහාරක මුර යාත්‍රා පළඳනාව	286
9	75 වන නිදහස් සංවත්සර සමරු පදක්කම	57
10	මාණ්ඩලික නිලධාරී සුදුසුකම් ලැබීමේ පුහුණු පළඳනාව	27
11	විදේශ සේවා පදක්කම	136
12	පූර්ණ කාලීන පාඨමාලාවන් සඳහා වූ පළඳනාව	77
එකතුව		**3131**

2.1.5 <u>නාවික හමුදා පුද්ගලයින්හට පුහුණු හා පාඨමාලා ලබා දීම</u>

පාඨමාලා වර්ගය	පුහුණුව ලැබූ ප්‍රමාණය	
	නිලධාරීන්	නාවිකයින්
අභ්‍යන්තර	530	8814
බාහිර	655	1660
විදේශීය	277	118
විභාග	258	4145
එකතුව	**1720**	**14737**

2.1.6 <u>නාවික හමුදා පුද්ගලයින්ගේ සුබසාධනයට අදාළ කටයුතු ඉටු කිරීම</u>

අ. ඉදුරාම ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් මියගිය සහ අතුරුදහන් වූ නාවික පුද්ගලයින්ගේ ළඟම ඥාතීන් සහ ආබාධිතව විශ්‍රාම ගන්වන ලද නාවික පුද්ගලයින් සහ ඔවුන්ගේ පවුල් සඳහා වාර්ෂිකව සිදු කරනු ලබන සුවදුක් විමසීමේ වැඩසටහන 2025 වර්ෂය සඳහා දෙසැම්බර් මාසය තුළ ක්‍රියාත්මක කරන ලද අතර, එහිදී ප්‍රේෂණපත් මඟින් රු. 14,928,000.00ක වටිනාකමින් යුතු මුදලක් සහ නාවික දින දර්ශන නාවික පුද්ගලයින් සහ ඔවුන්ගේ පවුල් සඳහා ලබා දීමට කටයුතු කරන ලදි.

ආ. ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී මියගිය/ අතුරුදහන් වූ නාවික පුද්ගලයින්ගේ ළඟම ඥාතීන් සහ ආබාධිත විශ්‍රාමික නාවික පුද්ගලයින් වෙත ඔවුන්ගේ හදිසි ප්‍රතිකාර සඳහා සහ සුබසාධන කටයුතු වෙනුවෙන් රු. 3,901,563.82ක මූල්‍යාධාර ලබා දීමට කටයුතු කර ඇත.

ඇ. ශ්‍රී ලංකා නාවික හමුදා සේවයෙන් විශ්‍රාම ගොස් සිටියදී මියගිය නාවික පුද්ගලයින්ගේ අවමංගල්‍යකදී අවමංගල්‍යාධාර මුදලක් වශයෙන් ළඟම ඥාතීන් හට රු. 100,000.00ක මුදලක් ලබා දෙනු ලබන අතර, 2025 වර්ෂය සඳහා මියගිය විශ්‍රාමික නාවික පුද්ගලයින් 156 දෙනෙකුගේ ළඟම ඥාතීන් හට රු. 15,600,000.00ක මුදලක් අවමංගල්‍යාධාර ලෙස ලබා දී ඇත.

ඈ. නැවිරු සවිය (නාවික සුවසහන) අරමුදල මඟින් 2025 වර්ෂය තුළ නාවික හමුදා සාමාජිකයින් සහ ඔවුන්ගේ ළඟම ඥාතීන් සඳහා බරපතල රෝගාබාධ හා සැත්කම් වෙනුවෙන් රු. 316,335,027.36ක මුදලක් ලබා දී ඇත.

ඉ. රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක ''අපි වෙනුවෙන් අපි'' නිවාස ව්‍යාපෘතිය මඟින් අර්ධ නිවාස 87ක් ලබා දී ඇත. ''මෙත් සෙවන'' අර්ධ නිවාස ව්‍යාපෘතිය මඟින් නිවාස 06ක් ලබා දී ඇති අතර, එම නිවාස වල වැඩ කටයුතු සිදු කරමින් පවති.

ඊ. 2025 වර්ෂය තුළ නාවික සමාජීය මෙහෙවර අරමුදල මඟින් ශල්‍යකර්ම සහ වෛද්‍යාධාර ලබා දීම සඳහා රු. 26,712,979.14ක මුදලක් ලබා දී ඇත.

2.1.7 **<u>මුහුදු සීමා උල්ලංඝනය කරමින් නීති විරෝධී භාණ්ඩ හා සේවා ජාවාරම් වැළැක්වීම</u>**

අත්අඩංගුවට ගන්නා ලද සහ සොයා ගන්නා ලද නීති විරෝධී සංක්‍රමණිකයින්, නීති විරෝධී ධීවර කටයුතු, නීති විරෝධී වෙනත් ද්‍රව්‍ය සහ පුද්ගලයින් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

අ. අවි ආයුධ අත්අඩංගුවට ගැනීම් සහ සොයා ගැනීම්

(1)	දේශීය නිෂ්පාදිත ගිනි අවි	- ගණනින්	07
(2)	අත් බෝම්බ	- ගණනින්	18
(3)	60 මිමි මෝටාර් බෝම්බ	- ගණනින්	04
(4)	ඒපී බෝම්බ	- ගණනින්	02
(5)	කොටන තුවක්කු උණ්ඩ	- ගණනින්	10
(6)	7.65 මිමි පැති අවි ජීව උණ්ඩ	- ගණනින්	40
(7)	බෝර 12 ගිනි අවි	- ගණනින්	01
(8)	ක්ලේමෝ බෝම්බ කවර	- ගණනින්	01
(9)	7.62 x 54 මිමි ජීව උණ්ඩ	- ගණනින්	06
(10)	7.62 x 39 මිමි ජීව උණ්ඩ	- ගණනින්	1648
(11)	පැති අවි	- ගණනින්	04
(12)	ආටිලරි හිස් පතුරම්	- ගණනින්	01
(13)	පැති අවි පතුරම් (ගැබ්)	- ගණනින්	04
(14)	තම්ල් ගුණ්ඩු	- ගණනින්	03
(15)	පුවස්	- ගණනින්	01
(16)	අත්අඩංගුවට ගත් පුද්ගලයින්	- ගණනින්	37

ආ. නීති විරෝධී ධීවර කටයුතු වැළැක්වීම්

(1)	අත්අඩංගුවට ගත් ට්‍රෝලර් යාත්‍රා මෙරට	- ගණනින්	24
(2)	අත්අඩංගුවට ගත් ට්‍රෝලර් යාත්‍රා (ඉන්දියන්)	- ගණනින්	44
(3)	අත්අඩංගුවට ගත් ඩිංගි යාත්‍රා	- ගණනින්	377
(4)	අත්අඩංගුවට ගත් වල්ලම්	- ගණනින්	09
(5)	නීති විරෝධී දැල් ආම්පන්න	- ගණනින්	3051
(6)	අත්අඩංගුවට ගත් පුද්ගලයින් මෙරට	- ගණනින්	1117
(7)	අත්අඩංගුවට ගත් පුද්ගලයින් (ඉන්දියන්)	- ගණනින්	346

ඇ. නීති විරෝධී වෙනත් ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීම් සහ සොයා ගැනීම්

(1)	බීඩි කොළ	- කි.ග්‍රෑ.	67,200.96
(2)	දුම්වැටි	- ගණනින්	420,385
(3)	මත්පැන්	- බෝතල්	213
(4)	බියර්	- කෑන්	9
(5)	කෘමි නාශක	- බෝතල්	170,603
(6)	රත්‍රං	- කි.ග්‍රෑ.	24.5
(7)	ගජමුතු	- ගණනින්	4
(8)	කැස්බෑ මස්	- කි.ග්‍රෑ.	199.364
(9)	ගෝණ මස්	- කි.ග්‍රෑ.	218.00
(10)	ඇම්බර්	- ග්‍රෑම්.	0.465
(11)	කහ	- කි.ග්‍රෑ.	2,623.00
(12)	බීඩි	- ගණනින්	29,120
(13)	හක් බෙල්ලෝ	- ගණනින්	2,365
(14)	එනසාල්	- කි.ග්‍රෑ.	1,778.42
(15)	කජු	- කි.ග්‍රෑ.	10.00
(16)	ඉහුරු	- කි.ග්‍රෑ.	7,186.70
(17)	වල් ඌරු මස්	- කි.ග්‍රෑ.	18.8
(18)	දඩ මස්	- කි.ග්‍රෑ.	199.00
(19)	මුව මස්	- කි.ග්‍රෑ.	8.00
(20)	මුහුදු කුඩැල්ලන්	- ගණනින්	22,803
(21)	ජීවී කැස්බෑවන්	- ගණනින්	2
(22)	පාවහන්	- ගණනින්	843
(23)	ඖෂධ	- ගණනින්	78,006
(24)	සතුන්	- ගණනින්	634
(25)	කඩු	- ගණනින්	4
(26)	වැලි	- කියුබ්	1
(27)	ඇට වර්ග	- පැකට්	2395
		- කි.ග්‍රෑ.	203.15
(28)	අත්අඩංගුවට ගත් පුද්ගලයින්	- ගණනින්	364

ඈ. නීති විරෝධී සංක්‍රමණිකයින් අත්අඩංගුවට ගැනීම

(1)	අවස්ථා 03ක දී මුහුදේ දී අත්අඩංගුවට ගත් පුද්ගලයින් ගණන	- 09
(2)	අවස්ථා 11ක දී ගොඩබිමෙන් අත්අඩංගුවට ගත් පුද්ගලයින්	- 23
(3)	අත්අඩංගුවට ගත් යාත්‍රා ගණන	- 06

2.1.8 <u>**අන්තර්ජාතික ආරක්ෂක සහයෝගීතාව හා සාම සාධක රාජකාරී**</u>

අ. 2025 වර්ෂයේ එක් නිලධාරියෙකු ලේබනනයේ එක්සත් ජාතීන්ගේ රාජකාරී සඳහා විදෙස්ගත කිරීමට කටයුතු කර ඇත.

ආ. 2025 වර්ෂයේ නිලධාරීන් දෙදෙනෙකු බටහිර සහරාහි එක්සත් ජාතීන්ගේ මෙහෙයුම් රාජකාරී සඳහා අනුයුක්ත කර ඇත.

ඇ. 2025 අප්‍රේල් මාසයේ මියන්මාර් රාජ්‍යය මුහුණ දුන් දරුණු අපදා තත්ත්වය හමුවේ සහන කටයුතු සඳහා ශ්‍රී ලංකා නාවික හමුදා වෛද්‍ය අංශයේ දායකත්වය ලබා දීම.

ඈ. එක්සත් රාජධානියේ සාම සාධක හමුදාවේ සහය සඳහා නාවික හමුදා වෛද්‍ය නිලධාරීන් දෙදෙනෙකු දකුණු සුඩානය වෙත 2025 වර්ෂයේදී අනුයුක්ත කිරීම.

ඉ. ශ්‍රී ලංකා නාවික හමුදාව 2025 වර්ෂයේ බහරේන්හි ඒකාබද්ධ සමුද්‍රීය බලකායේ 154 වැනි කාර්යසාධක බලකායේ අණ භාරගැනීම සිදු කළ අතර, ඒ සඳහා නිලධාරීන් 05 දෙනෙකු අනුයුක්ත කරන ලදී.

2.1.9 **<u>මත්ද්‍රව්‍ය උවදුරෙන් නිදහස් රටක් ඇති කිරීම සඳහා වන උපායමාර්ග</u>**

අ. නාවික හමුදා බුද්ධි අංශ සාමාජිකයින් විසින් සපයනු ලැබූ තොරතුරු අනුව 2025 වර්ෂය තුළ අත්අඩංගුවට ගන්නා ලද/ සොයා ගන්නා ලද නීති විරෝධී මත්ද්‍රව්‍ය සහ ඒ සම්බන්ධව අත්අඩංගුවට ගත් පුද්ගලයින් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

(1)	හෙරොයින්	- කි.ග්‍රෑ.	1,050.52
(2)	ක්‍රිස්ටල් මෙතපිටමයින් (අයිස්)	- කි.ග්‍රෑ.	2,982.82
(3)	කේරළ ගංජා	- කි.ග්‍රෑ.	5,768.33
(4)	දේශීය ගංජා	- කි.ග්‍රෑ.	257.043
		- පැල	04
(5)	මෝදක	- ගණනින්	5,054
(6)	මත්පෙති	- ගණනින්	1,683,722
(7)	කසිප්පු	- ලීටර්	160
(8)	ගෝඩා	- ලීටර්	1920
(9)	හෂීශ්	- කි.ග්‍රෑ.	33.43
(10)	කොකේන්	- ග්‍රෑම්	0.732
(11)	කුෂ්	- කි.ග්‍රෑ.	5.60
(12)	අත්අඩංගුවට ගත් පුද්ගලයින්	- ගණනින්	280

ආ. 2025 වර්ෂය තුළ මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් 549ක ප්‍රමාණයක් සියලුම නාවික විධානයන් ආවරණය වන පරිදි පැවැත්වීමට කටයුතු කිරීම සහ මත්ද්‍රව්‍ය හා විවිධ ඇබ්බැහිවීම් වලට ගොදුරු වූ නාවික පුද්ගලයින් 47දෙනෙකු පුනුරුත්ථාපනය කර සමාජගත කිරීමට කටයුතු කිරීම.

ඇ. සියලුම නාවික විධානයන්හි දෛනිකව ප්‍රතිකාර සඳහා නාවික රෝහල් හා දන්ත ශල්‍යාගාර වෙත පැමිණෙන නාවික පුද්ගලයන් හට දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන, බුලත්විට හා අන්තරායදායක මත්ද්‍රව්‍ය භාවිතයේ ඇති අහිතකර බලපෑම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සහ ඊට අදාළ විඩියෝ දර්ශන රූපවාහිණිය ඔස්සේ ප්‍රදර්ශනය කිරීම, මත්ද්‍රව්‍ය නිසා විවිධ රෝගී තත්ත්වයන් සඳහා ගොදුරු වූ නාවික පුද්ගලයින් ඊට අදාළ සායන වෙත යොමු කරවීම.

2.1.10 **<u>ග්‍රාමීය ප්‍රජා ආරක්ෂාව හා සුබසාධනය සහ ජීවනෝපාය දායකත්වය, රැකියා උත්පාදනය හා ආපදා කළමනාකරණයට සහය දැක්වීම</u>**

අ. සොරොව් අලුත්වැඩියා කිරීම්, ගංවතුර තත්ත්වයන් ඉදිකිරීම් සහ සංවර්ධන යන කටයුතු සඳහා අවස්ථාවන් 71ක දී කිමිදුම් කණ්ඩායම්හි දායකත්වය ලබා දීමට කටයුතු කර ඇත.

ආ. ආගමික උත්සව, ගංවතුර තත්වයන් සහ ජල ක්‍රීඩා තරඟ යන කටයුතු සඳහා අවස්ථා 25ක දී ජීවිතාරක්ෂක රාජකාරි වෙනුවෙන් ජීවිතාරක්ෂක කණ්ඩායම්හි දායකත්වය ලබා දී ඇත.

ඇ. 2025 ජනවාරි 01 වන දින සිට 2025 දෙසැම්බර් 31 වන දින දක්වා මෘතශරීර 57ක් සෙවීමේ කටයුතු සඳහා සහභාගී වී ඇති අතර, ඉන් මෘතශරීර 25ක් සොයා ගෙන ඇත.

ඈ. සම්පීඩන කුඨීර ප්‍රතිකාර, අපරාධ පරීක්ෂණ කටයුතු සඳහා සහ වෙනත් රාජකාරි කටයුතු සඳහා අවස්ථාවන් 71ක දී කිමිදුම් කණ්ඩායම්හි දායකත්වය ලබා දීමට කටයුතු කර ඇත.

ඉ. ග්‍රාමීය ප්‍රජා ආරක්ෂාව හා සුබසාධනය වෙනුවෙන් රෝහල් 07ක් සහ පාසල් 07ක් ප්‍රතිසංස්කරණය/ ඉදිකිරීමට ශ්‍රම දායකත්වය හා දැනුම 2025 වර්ෂයේදී ලබා දී ඇත.

ඊ. ‘ක්ලීන් ශ්‍රී ලංකා’ වැඩසටහන යටතේ ග්‍රාමීය ප්‍රජා ආරක්ෂාව හා සුබසාධනය වෙනුවෙන් ශ්‍රම දායකත්වය හා දැනුම ලබා දී ඇත.

උ. ‘දිවිවා’ සුළි කුණාටුව අතරතුර ශ්‍රී ලංකා නාවික හමුදාවේ ගංවතුර ප්‍රතිචාර කණ්ඩායම් (FRTs) විසින් පුද්ගලයන් 1,378 දෙනෙකු ගලවාගෙන, පුද්ගලයන් 27,573 දෙනෙකු සඳහා ජීවිතාරක්ෂක යාත්‍රා මඟින් ආරක්ෂක ස්ථාන වෙත ජල ප්‍රවාහන පහසුකම් සලසා දුන් අතර, හදිසි ප්‍රතිචාර අවධියේදී ආහාර පාර්සල් 6,100ක් ජීවිතාරක්ෂක යාත්‍රා මඟින් බෙදාහැර ඇත. එමෙන්ම 2025 දෙසැම්බර් මස සියලුම නාවික පුද්ගලයින්ගේ මාසික වේතනයෙන් එක් දිනක වැටුපෙන් රු. 73,963,879.71ක මුදලක් ආපදාවට පත් වූ ජනතාව වෙනුවෙන් ලබා දීම.

ඌ. ආපදා පසු අවධිය තුළ අවතැන්වූ හා පීඩාවට පත්වූ ජනතාව හට ශ්‍රී ලංකා නාවික හමුදාව තුළ පවතින ජංගම මුළුතැන්ගෙයි හතරක් යොදවා, සුළි කුණාටුවෙන් පීඩාවට පත් ප්‍රජාවන් සඳහා පිසූ ආහාර වේල් පුද්ගලයන් 26,693ක් හට බෙදාහැර ඇත. මීට අමතරව, ‘දිවිවා’ සුළි කුණාටුවෙන් පීඩාවට පත් සිවිල් වැසියන් වෙත RO යන්ත්‍ර භාවිතා කර පිරිසිදු කළ ජලය ලීටර් 74,650ක් සැපයීමට කටයුතු සිදු කර ඇත. සුළි කුණාටුවෙන් පසු පාරිසරික ප්‍රතිසංස්කරණ ප්‍රයත්නයන්හි කොටසක් ලෙස නාවික හමුදා පුද්ගලයින් විසින් ළිං 1,111ක්, නිවාස 85ක් සහ පොදු ස්ථාන 247ක් පිරිසිදු කර ඇත.

එ. ක්ෂණික ප්‍රතිචාර මුදවාගැනීමේ සහ සහන ඒකකය (4RU) මඟින් මුදල් ගෙවීමකින් තොරව අවස්ථා 69ක දී ජීවිතාරක්ෂක සේවාවන් ලබා දී ඇති අතර, එහි ඇස්තමේන්තුගත මෙහෙයුම් පිරිවැය රු. 38,971,216.09 කි. තවද, සුවිශේෂී මුලපිරීමක් ලෙස, ගඟේවාඩියේ පිහිටි ශ්‍රී ලංකා නාවික හමුදා ආපදා කළමනාකරණ පුහුණු පාසල (SLN DMTS) මඟින් ත්‍රිවිධ හමුදාව, රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන අතර අන්තර් සහයෝගීතාව වර්ධනය කරමින්, පළමු වරට මානුෂීය ආධාර සහ ආපදා සහන (HADR) අභ්‍යාසය සාර්ථකව සංවිධානය කර ක්‍රියාත්මක කරන ලදි. මීට අමතරව, ශ්‍රී ලංකා නාවික හමුදා ආපදා කළමනාකරණ පුහුණු පාසල විසින්, ප්‍රජා පාදක ආපදා සූදානම සඳහා ධාරිතා ගොඩනැගීමේ පියවරක් ලෙස, මුදල් ගෙවීමකින් තොරව සිවිල්/ආයතන සඳහා අවස්ථා 05ක දී ජීවිතාරක්ෂක සහ ආපදා ප්‍රතිචාර පුහුණුව ලබා දී ඇත.

2.1.11 <u>නාවික හමුදාව මඟින් බාහිර ආයතන සඳහා සිදු කරන ලද ව්‍යාපෘතීන්</u>

නාවික හමුදාව මඟින් බාහිර ආයතන සඳහා සිදු කරන ලද ව්‍යාපෘතීන්.

අනු අංකය	විස්තරය	ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තු ගත මුළු මුදල (රු. මිලි)	**2025** වර්ෂය තුළ නිම කරන ලද ව්‍යාපෘති ගණන	**2025** වර්ෂය තුළ නිම නොවූ ව්‍යාපෘති ගණන	**2025** වර්ෂය තුළ සිදු කරන ලද මුළු ව්‍යාපෘති ගණන
1	ආගමික ස්ථාන	12.430	58	61	119
2	ආගමික නොවන ස්ථාන	7,027.83	315	64	379

2.1.12 <u>නාවික පර්යේෂණ හා සංවර්ධන ඒකකය (ප්‍රති ආශ්‍රැනිකරණ යන්ත්‍ර) විසින් සිදු කරන ලද ව්‍යාපෘති පිළිබඳ විස්තර</u>

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති		ජනාධිපති ලේකම් කාර්යාලයේ ප්‍රතිපාදන මත සිදුකරන ලද ව්‍යාපෘති		නාවික හමුදාව තුළ සිදු කරන ලද ව්‍යාපෘති		විවිධ පරිත්‍යාගශීලීන් විසින් ඉදිරිපත් කර සිදු කරන ලද ව්‍යාපෘති		එකතුව	
වැඩ අවසන් කරන ලද ව්‍යාපෘති	වැඩ සිදු කරමින් පවතින ව්‍යාපෘති	වැඩ අවසන් කරන ලද ව්‍යාපෘති	වැඩ සිදු කරමින් පවතින ව්‍යාපෘති	වැඩ අවසන් කරන ලද ව්‍යාපෘති	වැඩ සිදු කරමින් පවතින ව්‍යාපෘති	වැඩ අවසන් කරන ලද ව්‍යාපෘති	වැඩ සිදු කරමින් පවතින ව්‍යාපෘති	වැඩ අවසන් කරන ලද ව්‍යාපෘති	වැඩ සිදු කරමින් පවතින ව්‍යාපෘති
3	1	49	-	2	-	23	7	77	8

2.1.13 **<u>නාවික පුද්ගලයින් සහ සිවිල් ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය නගා සිටුවීම සඳහා සහය දැක්වීම</u>**

අ. <u>නිරෝගීමත් නාවික හමුදාවක් (Healthy Navy)</u> - මෙම වැඩසටහන මඟින් නාවික පුද්ගලයන්හට බෝ නොවන රෝග (NCDs) ඇති වීම අවම කිරීම සඳහා සෞඛ්‍යමය පුරුදු ඇති කිරීම, ව්‍යායාම කිරීම සඳහා පෙළඹවීම, නිවැරදි පෝෂණය සම්බන්ධයෙන් උපදෙස් ලබා දීම සහ සෞඛ්‍ය අධ්‍යාපනය ලබා දීම.

ආ. <u>සුවදිවි මධ්‍යස්ථානය (Healthy Living Center)</u> - මෙම වැඩසටහන සෞඛ්‍ය අමාත්‍යාංශයේ සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන්වලට සමගාමීව සුවදිවි මධ්‍යස්ථානය මඟින් දියවැඩියාව, අධි රුධිර පීඩනය සහ තරබාරුකම වැනි බෝ නොවන රෝග සම්බන්ධයෙන් දිනපතා සෞඛ්‍ය අධ්‍යාපන දැනුවත් කිරීම් නාවික රෝහල්වල සිදු කිරීම.

ඇ. සියලුම නාවික කඳවුරු ආවරණය වන පරිදි එම ආයතනයන්හි රාජකාරී නියුතු සියලුම නාවික පුද්ගලයින් සඳහා බෝ නොවන රෝග සම්බන්ධයෙන් දැනුවත් කිරීම සහ සෞඛ්‍ය දැනුවත් කිරීමේ වැඩසටහන්, ලිංගාශ්‍රිත රෝග බෝවීම වැළැක්වීම, පෞද්ගලික සනීපාරක්ෂාව, ආහාර ආරක්ෂාව, මාර්ග අනතුරු වළක්වා ගැනීම සහ බෝ නොවන රෝග පිළිබඳ විශේෂ වැඩසටහන් පැවැත්වීම.

ඈ. කිමිදුම් වෛද්‍ය ප්‍රතිකාර (Diving Medicine Treatment – Decompression Sickness) 2025 වර්ෂයෙදී දේශීය සහ විදේශීය කිමිදුම්කරුවන් 17ක් හට සිදු වූ කිමිදුම් රෝගී තත්වයන්වලදී ඔවුන් හට ප්‍රතිකාර කටයුතු සිදු කිරීම.

ඉ. දිවයින තුළ උද්ගතවන ස්වභාවික ව්‍යසන අවස්ථාවලදී සිවිල් ප්‍රජාව වෙත වෛද්‍ය පහසුකම් සැපයීම.

ඊ. රජයේ රෝහල් හා සම්බන්ධීකරණය වී සියලුම නාවික විධානයන් ආවරණය වන පරිදි ලේ දන්දීමේ වැඩසටහන් පැවැත්වීම (2025 වර්ෂය සඳහා වැඩසටහන් 23ක් සිදු කර ඇත)

උ. නාවික පුද්ගලයින්, නාවික පුද්ගලයින්ගේ පවුල්වල සාමාජිකයින්, නාවික හමුදා සිවිල් සේවකයින්, විශ්‍රාමික නාවික හමුදා පුද්ගලයින්, ආබාධිත නාවික පුද්ගලයින්, ආරක්ෂක අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය සහ ජනාධිපති ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර නාවික රෝහල් මඟින් ලබා දීම.

ඌ. නාවික හමුදා පුද්ගලයින්ගේ සහ සිවිල් ජනතාවගේ මුඛ සෞඛ්‍ය තත්ත්වය උසස් මට්ටමකට ළඟාකර ගැනීම සඳහා විධාන දන්ත ශල්‍යාගාර හා ජංගම දන්ත ශල්‍යාගාර බස් රථය මඟින් සියලුම නාවික විධානයන් දිවයිනේ විවිධ ප්‍රදේශ ආවරණය වන පරිදි ජංගම දන්ත වෛද්‍ය සායන හා මුඛ සෞඛ්‍ය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

2.1.14 **<u>නාවික හමුදාව ලද සුවිශේෂී ජයග්‍රහණ</u>**

අ. ශ්‍රී ලංකා නාවික හමුදා පුද්ගලයින් විසින් 2025 වර්ෂය තුළ පහත සඳහන් ප්‍රධාන ක්‍රීඩා ජයග්‍රහණ ලබා ගැනීමට කටයුතු කර ඇත.

ක්‍රීඩා තරඟාවලි සම්බන්ධ විස්තර	**රන් පදක්කම්**	**රිදී පදක්කම්**	**ලෝකඩ පදක්කම්**
49 වන ජාතික මහා කරාතේ තරඟය		4	3
දකුණු ආසියානු කරාතේ ශූරතාවලිය 2025	1		2
ගජබා සුපර් ක්‍රෝස්			1
රාජ්‍ය සේවා දැල්පන්දු තරඟාවලිය (ලීග්)	1		
රාජ්‍ය සේවා දැල්පන්දු තරඟාවලිය (පිළිමලුන් පිටුදැකීම)		1	
ජාතික පංච ප්‍රයාම තරඟාවලිය 2025		1	
2025 ජාතික හෑන්ඩ්බෝල් තරඟාවලිය	1		
2025 පොදුරාජ්‍ය මණ්ඩලීය තරඟාවලිය		1	

40 වන ජ්‍යෙෂ්ඨ සහ අතරමැදි ජාතික ඔරු පැදීමේ ශූරතාවලිය - 2025 (කණ්ඩායම්)		2	
40 වන ජ්‍යෙෂ්ඨ සහ අතරමැදි ජාතික ඔරු පැදීමේ ශූරතාවලිය - 2025 (තනි පුද්ගල)			2
වාර්ෂික කිලෝමීටර් 10 විවෘත ජල පිහිනුම් ශූරතාවලිය - 2025		1	
වාර්ෂික කිලෝමීටර් 05 විවෘත ජල පිහිනුම් ශූරතාවලිය - 2025		1	
86 වන වාර්ෂික සැතපුම් දෙකේ මුහුදු පිහිනුම් ශූරතාවලිය - 2025			2
ජාතික සහ කනිෂ්ඨ ජාතික දිගු පිහිනුම් ශූරතාවලිය - 2025	1		2
ජාතික සහ කනිෂ්ඨ ජාතික කෙටි පිහිනුම් ශූරතාවලිය - 2025		1	2
එකතුව	**4**	**12**	**14**

ආ. 2025 වර්ෂය තුළදී විදුලි හා විද්‍යුත් අංශයේ නාවිකයින් 137ක් ජාතික වෘත්තීය පුහුණු සහතික පත්‍ර IV ලබා ගැනීම.

2.1.15 <u>**නාවික හමුදාවට මුහුණ පෑමට සිදු වී ඇති අභියෝග**</u>

අ. නාවික හමුදා පිරිස් බලයෙහි ඌණතාවය සහ 2025 දෙසැම්බර් මස 31 වන දිනට පිරිස් බලය සම්බන්ධ විස්තර පහත පරිදි වේ.

විස්තරය	**අනුමත පිරිස් බලය**	**පවතින පිරිස් බලය**	**ඌණතාවය**
නිලධාරීන්	3,768	3,092	676
නාවිකයින්	49,232	38,525	10,707
එකතුව	53,000	41,617	11,383

ආ. පවතින පිරිස් බල ඌණතාවයට සාපේක්ෂව ආවරණය කළ යුතු භූමි ප්‍රමාණයේ විශාලත්වය මත ඇති වන ගැටලු.

ඇ. ශ්‍රී ලංකා නාවික හමුදාව සතුව පවතින විශාල නාවික යාත්‍රා නවතා තැබීම සඳහා ත්‍රිකුණාමල නාවික කඳවුරෙහි ඉදිකරමින් පවතින නාවික ජැටිය රටේ පැවති ආර්ථික අර්බුදය මධ්‍යයේ අත්හිටුවීමකින් තොරව ඉදිකිරීම් කටයුතු සිදු කරගෙන යාමට හැකිවීම සහ 2026 වර්ෂය තුළ කඩිනමින් නිම කිරීම.

ඈ. Malware, Ransomware, Phishing සහ Denial of Service (DoS) වැනි සයිබර් ප්‍රහාර වැඩි වශයෙන් වාර්තා වීම හේතුවෙන්, නාවික හමුදාවේ ජාල හා පද්ධති නිරන්තර අවදානමකට ලක්වීම ප්‍රධාන අභියෝගයක් වී ඇත.

2.1.16 <u>**නාවික හමුදාව ළඟා කර ගැනීමට නියමිත ප්‍රධාන ඉදිරි ඉලක්ක**</u>

අ. ශ්‍රී ලංකා නාවික හමුදා පුද්ගලයින්ගේ සුබසාධනය සහ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ අරමුණින්, 2026 වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ඵලදායි ලෙස යොදා ගනිමින් නව ඉදිකිරීම් ව්‍යාපෘති 13ක් සඳහා රු.මි. 180.0ක් ද, යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති 20ක් සඳහා රු.මි. 81.0ක් ද, ගොඩනැගිලි හා ව්‍යුහ නවීකරණය සහ අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘති 56ක් සඳහා රු.මි. 180.0ක් ද භාවිත කර මුළු ව්‍යාපෘති 89ක් 2026 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

ආ. ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර සාගරික කලාපය (IMBL) තුළ සිදු වන විදේශීය ධීවරයින්ගේ නීති විරෝධී කටයුතුවලට එරෙහිව සිදු කරනු ලබන මෙහෙයුම් සඳහා සෘජුවම දියත් කළ හැකි පරිද්දෙන් වානේ බඳක් සහිත සමාන දිගින් යුක්ත යාත්‍රාවක් නිෂ්පාදනය කිරීම.

ඇ. ශ්‍රී ලංකා නාවික හමුදාව සතු යන්ත්‍රෝපකරණ පරීක්ෂණය සහ අත්හදා බැලීම් ඒකකය පුළුල් කිරීම.

ඈ. වේව්රයිඩර් වර්ගයේ වෙරළාරක්ෂක මුර යාත්‍රා 06ක් සහ කිමිදුම් මෙහෙයුම් සඳහා රිබ් (RHIB) යාත්‍රා 02ක් නිෂ්පාදනය කිරීම.

ඉ. ඉන්දියානු රජය මඟින් ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත පාවෙන තඨාකාංගණයක් ප්‍රදානයක් වශයෙන් ලබා දීම සඳහා අවශ්‍ය ගිවිසුම් අත්සන් කර ඇත. මේ වන විට Goa Shipyard ආයතනය එය නිපදවීමේ කටයුතු ආරම්භ කර ඇති අතර, 2025 වර්ෂයේදී එම ව්‍යාපෘතියෙහි 80.9% ප්‍රගතියක් අවසන් කර ඇත. එම පාවෙන තඨාකාංගණය 2026 වසරේ හතරවන කාර්තුව තුළදී ශ්‍රී ලංකාව වෙත ලබා දීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවති.

ඊ. නව තාක්ෂණික ඩිජිටල් සෞඛ්‍ය වාර්තා පද්ධතියක් ක්‍රියාත්මක කිරීම, නව තාක්ෂණික වෛද්‍ය උපකරණ මිලදී ගැනීම තුළින් හෘද, විකලාංග, අක්ෂි ඇතුළු විශේෂිත සත්කාර ඒකක පුළුල් කිරීම මෙන්ම නාවික රෝහල (කොළඹ) හි සූර්ය බලශක්ති පද්ධතියක් ස්ථාපිත කිරීම.

උ. කිමිදුම් ප්‍රතිකාර කටයුතු පුළුල් කිරීම සඳහා නාවික මහ රෝහල (කොළඹ) සහ නාවික රෝහල (දකුණු විධානය) හි ප්‍රතිපීඩන කුටීරයක් ස්ථාපිත කිරීම සහ ශ්‍රීලංනානෞ උත්තර සහ ශ්‍රීලංනානෞ විදුර ආයතනයන්හි නව දන්ත ශල්‍යාගාරයන් ස්ථාපිත කිරීම.

ඌ. දන්ත වෛද්‍ය ප්‍රතිකාර සඳහා පැමිණෙන රෝගීන් හට මාර්ගගත ක්‍රමයට දින ලබාදීම හා රෝගියා දැනුවත් කිරීම මෘදුකාංගයක් මඟින් සිදු කරන පද්ධතියක් නිර්මාණය කිරීම (Online Appointment System).

එ. NAVSTRAT 2030 මඟින් ශ්‍රී ලංකා නාවික හමුදාව තාක්ෂණිකව උසස්, ප්‍රශස්ත ලෙස ව්‍යුහගත සහ ක්‍රියාකාරීව ඵලදායී සමුද්‍රීය බලකායක් බවට පරිවර්තනය කිරීම සඳහා සම්බන්ධිත මාර්ගසටහනක් සපයයි. හැකියාවන් නවීකරණය, කාර්යමණ්ඩල ප්‍රශස්තිකරණය, අන්තර්-ආයතනික සංශෝධන සහ ශක්තිමත් හවුල්කාරිත්වයන් ක්‍රියාත්මක කිරීම තුළින්, 2030 වන විට ශ්‍රී ලංකාවේ සමුද්‍රීය අවශ්‍යතා ආරක්ෂා කිරීමට සහ කලාපීය ස්ථාවරත්වයට දායක වීමට ශ්‍රී ලංකා නාවික හමුදාව සම්පූර්ණයෙන්ම ස්ථානගත වනු ඇත. ආර්ථික සෞභාග්‍යය කේන්ද්‍ර කරගත් මෙම උපායමාර්ගය, සාගර සම්පත් ප්‍රශස්ත ලෙස භාවිත කිරීම සඳහා මාර්ගය සකස් කරමින්, ශ්‍රී ලංකාවේ වරාය හා මුහුදු ප්‍රදේශ ව්‍යාපාරික ගමනාගමනය සඳහා පමණක් නොව, තිරසාර වර්ධනයේ ශක්තිමත් පදනම් ලෙස ද පරිවර්තනය කිරීම.

ඒ. ශ්‍රී ලංකා නාවික හමුදාව 2030 වන විට ලබා ගැනීමට සැලසුම් කර ඇති අක්වෙරළ මුර සංචාරක නෞකා (OPVs) දෙකෙන් එකක් ලෙස, 2026 වසරේදී එක්සත් ජනපදය විසින් එක් OPV නෞකාවක් ලබා දීමට නියමිතය. මෙය සමුද්‍ර මෙහෙයුම් හැකියාව වර්ධනය කරමින්, ජාතික ආරක්ෂාව සහ ජාතික අවශ්‍යතා ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා පැවරී ඇති භූමිකා සහ කාර්යයන් කාර්යක්ෂමව ඉටු කිරීමට යොදා ගැනීම.

ඔ. 2030 වන විට 40,000ක කාර්ය මණ්ඩලයක් පවත්වා ගැනීම සඳහා, ශ්‍රී ලංකා නාවික හමුදාව 2026 දී නිලධාරීන් 200ක් සහ නාවිකයින් 5,000ක් බඳවා ගැනීමට කටයුතු කිරීම.

2.1.17 <u>නාවික හමුදාව තුළ සිදු කරන ප්‍රධාන ඉදිකිරීම් ව්‍යාපෘති</u>

අනු අංකය	ව්‍යාපෘතියේ නම	සිදු කරන ලද නාවික ප්‍රදේශය සහ ස්ථානය	ව්‍යාපෘතිය ආරම්භ කරන දිනය	ව්‍යාපෘතිය අවසන් කරන දිනය	ඇස්තමේන්තු ගත මුදල	**2025** දෙසැම්බර් **31** වන දිනට වියදම් කර ඇති මුදල	අවසන් කර ඇති වැඩ ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස **(2025.12.31** වන දිනට)
1	ත්‍රිකුණාමලය නාවික තඨාකාංගණයෙහි නාවික ජැටිය ඉදිකිරීමේ ව්‍යාපෘතිය	නැගෙනහිර නාවික පෙදෙස	24.03.2015	31.12.2026	7,582,240,000,000.00	4,763,455,706.21	74.50%

2	නාවික හා සාගරික විද්‍යාපීඨයේ නිලධාරී පුහුණු කිරීමේ සංචිතය ඉදිකිරීම	නැගෙනහිර නාවික පෙදෙස	20.02.2019	31.12.2026	679,000,000.00	566,271,551.00	84.9%
3	නාවික හා සාගරික විද්‍යාපීඨයේ නව සැපයුම් පාසල ඉදිකිරීම	නැගෙනහිර නාවික පෙදෙස	06.08.2025	31.12.2027	252,000,000.00	159,500,470.35	24.00%
4	විශේෂ යාත්‍රා බලඝණ මූලස්ථානයේ සිවි මහල් නිලධාරී වස්නය ඉදිකිරීම	නැගෙනහිර නාවික පෙදෙස	24.07.2019	31.01.2026	230,000,000.00	208,930,000.00	87.00%
5	විශේෂ යාත්‍රා බලඝණ මූලස්ථානයේ තෙමහල් පන්ති කාමර ගොඩනැගිල්ල ඉදිකිරීම	නැගෙනහිර නාවික පෙදෙස	31.05.2022	31.01.2026	276,000,000.00	10,025,712.53	97.5%
6	නාවික තඨාකාංගණයේ පෞරාණික ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම	නැගෙනහිර නාවික පෙදෙස	10.12.2016	31.12.2025	55,430,000.00	10,780,044.88	100.00%
7	ශ්‍රීලංනානෞ පැරකුම්බා ආයතනයේ අඩි 75ක සංඥා කුලුනක් ඉදිකිරීම	නැගෙනහිර නාවික පෙදෙස	01.05.2023	31.09.2025	14,000,000.00	11,311,506.36	100.00%
8	ශ්‍රීලංනානෞ නිස්ස අයතනයේ වසන්ත කරන්නාගොඩ ශ්‍රවණාගාරය නවීකරණය කිරීම	නැගෙනහිර නාවික පෙදෙස	01.06.2022	31.01.2026	27,500,000.00	6,075,954.70	79.33%
9	ශ්‍රීලංනානෞ ගැමුණු ආයතනයේ වැටුප් හා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ පස් මහල් ගොඩනැගිල්ල ඉදිකිරීම	බටහිර නාවික පෙදෙස	04.08.2021	17.12.2025	218,000,000.00	177,827,782.98	100.00%
10	වැලිසර මහල් දහයකින් යුත් කනිෂ්ඨ නාවිකයින්ගේ විවාහ නිවාස ඉදිකිරීම (පළමු අදියර)	බටහිර නාවික පෙදෙස	28.08.2019	31.12.2030	754,000,000.00	86,111,239.10	23.0%
11	දියතලාව කනිෂ්ඨ නිලධාරී නිවාඩු නිකේතනය ප්‍රතිසංස්කරණය කිරීම	බටහිර නාවික පෙදෙස	17.11.2024	22.12.2025	14,760,000.00	13,898,159.72	100.00%
12	ශ්‍රීලංනානෞ ලංකා රාජකීය නාවික ස්වේච්ඡා සංචිත සංගමය සඳහා යෝජිත කාර්යාල ගොඩනැගිල්ල	බටහිර නාවික පෙදෙස	24.10.2024	31.12.2026	17,600,000.00	4,654,943.00	47.00%

13	හම්බන්තොට නාවික හමුදා කඳවුරේ බහු කාර්යය ගොඩනැගිල්ල ඉදිකිරීම සහ ශ්‍රීලංනානෞ කාවන්තිස්ස ආයතනයේ පස් මහල් කනිෂ්ඨ නාවික නිවාසය ඉදිකිරීම	දකුණු නාවික පෙදෙස	17.06.2017	31.12.2026	360,000,000.00	209,345,423.22	47.00%
14	ශ්‍රීලංනානෞ නිපුණ ආයතනයේ පොදු භෝජනාගාරය සහ කනිෂ්ඨ නාවිකයින්ගේ නවාතැන් සඳහා සිවිමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම	දකුණු නාවික පෙදෙස	02.04.2024	31.12.2026	244,000,000.00	219,705,115.91	84.00%
15	ශ්‍රීලංනානෞ දක්ෂිණ ආයතනයේ අංක 02 දියත් මග ඉදිකිරීම (නෞකාවන් අලුත්වැඩියාව සඳහා දියත් මග පිළිසකර කිරීම)	දකුණු නාවික පෙදෙස	25.03.2023	31.12.2025	65,000,000.00	18,080,540.97	32.50%
16	ශ්‍රීලංනානෞ උත්තර ආයතනයේ විධාන නිවස්නය ඉදිකිරීම	උතුරු නාවික පෙදෙස	15.05.2015	30.12.2027	478,000,000.00	334,272,574.19	78.5%
17	ශ්‍රීලංනානෞ එළාර අංක 03 ජැටිය වැඩිදියුණු කිරීම	උතුරු නාවික පෙදෙස	15.07.2023	31.12.2026	72,000,000.00	39,915,157.85	50.0%
18	ශ්‍රීලංනානෞ ගජබා ආයතනය ඔලුතුඩායි වෙත විතැන් කිරීමේ ව්‍යාපෘතිය	උතුරු මැද නාවික පෙදෙස	03.02.2017	31.12.2027	450,000,000.00	247,571,348.36	68.30%
19	උතුරු මැද නාවික විධානයේ වෙරළ නිරීක්ෂණ මුර කුටි ඉදිකිරීම	උතුරු මැද නාවික පෙදෙස	16.02.2015	31.12.2026	55,460,000.00	43,077,737.00	57.00%
20	උතුරු මැද නාවික විධානයේ කොවිඩ් 19 ආශ්‍රිත නිරෝධායන මධ්‍යස්ථානවල ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීම (නාවික නිවාස සහ නාන කාමර වැඩිදියුණු කිරීම)	උතුරු මැද නාවික පෙදෙස	25.10.2020	31.12.2025	31,200,000.00	28,242,671.47	100.00%
21	උතුරු මැද නාවික විධානයේ මුලුතැන්ගෙවල් සහ ආහාර ගබඩා 06ක් ඉදිකිරීම	උතුරු මැද නාවික පෙදෙස	25.02.2022	31.12.2025	22,930,000.00	17,348,735.96	100.00%

22	ශ්‍රීලංනානෞ බුවනෙක ආයතනයේ යෝජිත ජැටිය වැඩි දියුණු කිරීම	උතුරු මැද නාවික පෙදෙස	10.09.2023	31.12.2026	20,000,000.00	3,461,362.11	30.00%
23	ශ්‍රීලංනානෞ දීසායු ආයතනයේ මීටර් 30ක් උස ස්වයං ආධාරක රේඩාර් කුලුනක් ඉදිකිරීම	ගිණිකොන නාවික පෙදෙස	28.08.2024	31.03.2025	16,263,350.00	12,303,362.10	100.00%
24	ශ්‍රීලංනානෞ මහානාග ආයතනයේ ජල බෙදාහැරීමේ පද්ධතිය ක්‍රියාත්මක කිරීම	ගිණිකොන නාවික පෙදෙස	01.02.2024	30.06.2026	41,283,319.13	26,788,955.95	43.00%
25	ශ්‍රීලංනානෞ විජය ආයතනයේ තෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම	වයඹ නාවික පෙදෙස	06.07.2019	30.12.2027	350,000,000.00	229,630,203.00	75.00%
26	නාවික ස්ථානගත කිරීම් මහව දෙමහල් පුහුණු ගොඩනැගිලි ඉදිකිරීම	වයඹ නාවික පෙදෙස	05.06.2025	30.12.2027	43,500,000.00	9,705,619.00	18.00%

<u>තිකුණාමලය නාවික තඹාකාංගණයෙහි නාවික ජැටිය ඉදිකිරීමේ ව්‍යාපෘතිය</u>





<u>නාවික හා සාගරික විද්‍යාපීඨයේ නිලධාරී පුහුණු කිරීමේ සංචිතය ඉදිකිරීම</u>





නාවික හා සාගරික විද්‍යාපීඨයේ නව සැපයුම් පාසල ඉදිකිරීම





විශේෂ යාත්‍රා බලඝණ මූලස්ථානයේ සිවි මහල් නිලධාරී නිවස්නය ඉදිකිරීම





විශේෂ යාත්‍රා බලඝණ මූලස්ථානයේ තෙමහල් පන්ති කාමර ගොඩනැගිල්ල ඉදිකිරීම





නාවික තඨාකාංගණයේ පෞරාණික ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම





ශ්‍රීලංනානෞ පැරකුම්බා ආයතනයේ අඩි 75 ක සංඥා කුලුනක් ඉදිකිරීම



ශ්‍රීලංනානෞ තිස්ස ආයතනයේ වසන්ත කරන්නාගොඩ ශ්‍රවණාගාරය නවීකරණය කිරීම





ශ්‍රීලංනානෞ ගැමුණු ආයතනයේ වැටුප් හා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ පස් මහල් ගොඩනැගිල්ල ඉදිකිරීම






වැලිසර මහල් දහයකින් යුත් කනිෂ්ඨ නාවිකයින්ගේ විවාහ නිවාස ඉදිකිරීම (පළමු අදියර)





දියතලාව කනිෂ්ඨ නිලධාරී නිවාඩු නිකේතනය ප්‍රතිසංස්කරණය කිරීම





ශ්‍රීලංනානෞ ලංකා රාජකීය නාවික ස්වේච්ඡා සංචිත සංගමය සඳහා යෝජිත කාර්යාල ගොඩනැගිල්ල





ශ්‍රීලංනානෞ කාවන්තිස්ස ආයතනයේ පස් මහල් කනිෂ්ඨ නාවික නිවාසය ඉදිකිරීම





ශ්‍රීලංනානෞ නිපුන ආයතනයේ පොදු භෝජනාගාරය සහ කනිෂ්ඨ නාවිකයින්ගේ නවාතැන් සඳහා සිවිමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම





ශ්‍රීලංනානෞ දක්ෂිණ ආයතනයේ අංක 02 දියත් මග ඉදිකිරීම (දියත් මග අලුත්වැඩියාව)





ශ්‍රීලංනානෞ උත්තර ආයතනයේ විධාන නිලධාරී නිවස්නය ඉදිකිරීම





ශ්‍රීලංනානෞ එළාර අංක 03 ජැටිය වැඩිදියුණු කිරීම





ශ්‍රීලංනානෞ ගජබා ආයතනය ඔලුතුඩායි වෙත විතැන් කිරීමේ ව්‍යාපෘතිය









<u>උතුරු මැද නාවික විධානයේ වෙරළ නිරීක්ෂණ මුර කුටි ඉදිකිරීම</u>





<u>උතුරු මැද නාවික විධානයේ කොවිඩ් 19 ආශ්‍රිත නිරෝධායන මධ්‍යස්ථානවල ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීම - (නාවික නිවාස සහ නාන කාමර වැඩිදියුණු කිරීම)</u>





<u>ශ්‍රීලංනානෞ බුවනෙක ආයතනයේ යෝජිත ජැටිය වැඩිදියුණු කිරීම</u>





උතුරු මැද නාවික විධානයේ මුළුතැන්ගෙවල් සහ ආහාර ගබඩා 06ක් ඉදිකිරීම





ශ්‍රීලංනානෞ දීසායු ආයතනයේ මීටර් 30ක් ස්වයං ආධාරක රේඩාර් කුලුනක් ඉදිකිරීම





ශ්‍රීලංනානෞ මහානාග ආයතනයේ ජල ටැංකිය ඉදිකිරීම සහ ජල බෙදාහැරීමේ පද්ධතිය ක්‍රියාත්මක කිරීම





ශ්‍රීලංනානෞ විජය ආයතනයේ තෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම





නාවික ස්ථානගත කිරීම් මහව දෙමහල් පුහුණු ගොඩනැගිලි ඉදිකිරීම





2.2 නාවික හමුදාවේ ඉදිරි දැක්ම

2.2.1 ප්‍රගතිය සහ ඉදිරි දැක්ම

අ. නාවික හමුදාවේ සංවර්ධනය සඳහා අවශ්‍ය සැලැස්මක් ශ්‍රී ලංකා නාවික හමුදාවේ සමුද්‍ර උපාය මාර්ගය 2025 යන ලේඛනය මඟින් 2017 වර්ෂයේ දී ප්‍රකාශයට පත්කොට තිබූ අතර, නාවික හමුදාවේ ප්‍රධාන නෞකා හා යාත්‍රාවන්ගේ අවශ්‍යතාවන් මත නාවික හමුදා ඉදිරි දැක්ම 2030 මඟින් ඉදිරි වර්ෂවල ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් අත්පත් කර ගැනීම පහත සඳහන් වගුවේ ආකාරයට සැලැසුම් සකස් කර ඇත.

යාත්‍රාව/ යාත්‍රා වර්ගය	**දැනට නාවික හමුදාව තුළ පවතින යාත්‍රා**	**2026-2030**	**2031-2035**	**2036-2040**
ෆ්‍රිගේට් (Frigates)	0	-	1	1
අක්වෙරළ නිරීක්ෂණ නෞකා (OPV)	8	1	2	4
වේග මිසයිල ප්‍රහාරක නෞකා (FMV)	2	-	4	2
වේග මුර යාත්‍රා (FGB) වෙරළ ආරක්ෂක මුර නෞකා (CPV)	11	2	4	4
වේග නිරීක්ෂණ යාත්‍රා (FPC)	2	-	1	-
බහුකාර්ය යාත්‍රාව (Multy-Purpose Vessel)	-	1	-	-
ටග් (Oceangoing Tug)	-	1	-	-
වේග ප්‍රහාරක යාත්‍රා (FAC)	47	(-4)	4	4
සහයක යාත්‍රා (P AUX)	1	1	-	1
ජල සම්ක්ෂණ යාත්‍රා (Hydrographic Survey Vessel)	-	1	-	-
ගොඩබෑමේ යාත්‍රා (LST)	1	-	1	1
ගොඩබෑමේ යාත්‍රා (LCM)	2	-	1	1
ගොඩබෑමේ යාත්‍රා (LCU)	2	1	1	-
ගොඩබෑමේ යාත්‍රා වායු කුෂන් LCAC (S)	-	-	1	1
වෙරළ නිරීක්ෂණ මුර යාත්‍රා (IPC) සහ වෙරළාසන්න මුර යාත්‍රා (Wave Rider)	102	15	6	10

ආ. වැලිසර නාවික යාත්‍රා තැනීමේ අංගනය මඟින් 2025 වර්ෂය තුළදී වෙරළ නිරීක්ෂණ මුර යාත්‍රා (IPC) 02ක් හා ඩිංගි යාත්‍රා (FGD) 07ක් ශ්‍රී ලංකා නාවික හමුදාව සඳහා නිපදවන ලදි.

2.2.2 <u>ශ්‍රී ලංකා නාවික හමුදාවේ දැක්ම - 2026</u>

අ. දිවයින වටා පවතින කි.මී 1340ක පමණ වෙරළ තීරය, ගොඩබිම සිට මූලික රේඛාවේ 12NM දක්වා පවතින දේශීය ජල තීරය (ගොඩබිමේ විශාලත්වයෙන් 1/3ක පමණ), යාබද මුහුදු කලාපය (මූලික රේඛාවේ 24NM දක්වා), අනන්‍ය ආර්ථික කලාපය, (මූලික රේඛාවේ සිට 200NM දක්වා ඇතුළු වර්ග කි.මී. 1,712,452 පමණ වන සුවිසල් මුහුදු තීරය යන කලාපයන්හි ආරක්ෂාව, සෙවුම් කටයුතු සහ මුදවා ගැනීමේ මෙහෙයුම් සිදු කිරීම සහ එහි වගකීම ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් දරනු ලබයි. තවද, ඉන්දියන් සාගරයේ ප්‍රධාන මුහුදු මාර්ගයේ කේන්ද්‍රගතව අප මාතෘ භූමිය පිහිටා ඇති අතර, ලෝකයේ තෙල්වලින් 66%ක්, තොග භාණ්ඩවලින් 40%ක් සහ බහාලුම් නැව්ගත කිරීම්වලින් 60%ක් හුවමාරු වන්නේ එම මාර්ගය හරහාය. තවද, සාගර කලාපවල පවත්නා ආරවුල්, අර්බුද සහ ගැටුම් හරහා ඇති වී තිබෙන අන්තර්ජාතික ආරක්ෂක තත්වය හා භූ දේශපාලනික වාතාවරණය සෘජුවම ශ්‍රී ලංකාවේ ආරක්ෂාවට විශේෂ වැදගත්කමක් ඇති කරනු ලබන අතර, ශ්‍රී ලංකාවට අයත් සාගර කලාපවල ආරක්ෂාව සම්බන්ධයෙන් වගකීම නාවික හමුදාවට දැරීමට සිදු වේ.

ආ. එපමණක් නොව වර්තමාන සතුරු ක්‍රියාකාරකම් සලකා බැලීමේ දී ඒවා සූක්ෂම, ජාලගත සහ සාම්ප්‍රදායික නොවන බව හඳුනාගෙන ඇත. එබැවින් ත්‍රස්තවාදී තර්ජන, ජාත්‍යන්තර අපරාධ, මුහුදු මංකොල්ලකෑම් හා තහනම් ධීවර කටයුතු යනාදිය තුළින් ඉන්දියන් සාගරය දැඩි අවදානමකට ලක්විය හැකි ය. එම අවදානමට මුහුණ දීමට අප නාවික හමුදාව ශක්තිමත් විය යුතු අතර, මෙලෙස අභියෝග බවට පත්ව ඇති ඉන්දියන් සාගර කලාපය තුළ සිදු වන නීතිමය නොවන, වාර්තා නොවන හා විධිමත් නොවන ධීවර කටයුතු (IUU) පිළිබඳව කටයුතු කිරීම ප්‍රධාන අභියෝගයක් වන අතර, එය ශ්‍රී ලංකාව මෙන්ම අනෙකුත් කලාපීය රටවල ආරක්ෂාවට තර්ජනයක් විය හැකි ය.

ඇ. ඉහත කරුණු සලකා බැලීමේ දී, ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් ඉන්දියන් සාගර කලාපය තුළ බුද්ධි තොරතුරු ලබා ගැනීම, ආවේක්ෂණ හා නිරීක්ෂණ කටයුතු වැඩි දියුණු කර ගැනීම සහ ඔත්තු බැලීමේ හැකියාව වැඩි දියුණු කරගැනීම මඟින් කලාපය තුළ ශ්‍රී ලංකා රාජ්‍යයේ සමුද්‍රීය ස්වෛරීභාවය ඇති කර ගැනීමට හා අනාගතයේ ඇති විය හැකි අභියෝග පිළිබඳව දැනුවත් වී සිටීමට උපකාරී වේ.

2.2.3 <u>ශ්‍රී ලංකා නාවික හමුදාවේ දැක්ම යටතේ යෝජිත ව්‍යාපෘති පිළිබඳ විස්තර</u>

අ. ශ්‍රී ලංකා නාවික හමුදාවේ නෞකා බලඝණය ශක්තිමත් කිරීමෙන් අප මුහුදු සීමාවේ ආරක්ෂාව සහතික කර එම මුහුදු සීමාව සියලු ජාතින්ගේ නිදහස් නෞකා ගමනාගමනයන් නිසි ආරක්ෂාවකින් සිදු කිරීමට සහ සියලු නාවික කටයුතු කාර්යක්ෂමව පවත්වාගෙන යාමට මඟ සැලසීම. මෙම වගකීම නිසි අයුරින් ඉටු කිරීම සඳහා අප හා සම්බන්ධව සිටින මිත්‍ර රටවල සහයෝගයෙන් ශ්‍රී ලංකා නාවික හමුදාවට නෞකාවන් ලබා ගැනීමට කටයුතු කිරීම.

ආ. නෞකා තුළ යල්පැනගිය පද්ධති හා උපකරණ සහ අවි පද්ධති ප්‍රතිස්ථාපනය කිරීම, විශේෂයෙන්ම සන්නිවේදන උපකරණ, ක්ෂුද්‍ර තරංග සම්බන්ධතා සඳහා අවශ්‍ය පද්ධති ප්‍රතිස්ථාපණය කිරීම තුළින් ශ්‍රී ලංකා නාවික හමුදාවේ නාවික මෙහෙයුම් ශක්තිය වැඩි දියුණු කර ගැනීම සහ ඉන්දීය සාගරික කලාපය තුළ සිදු විය හැකි සිදුවීම් සම්බන්ධව කල්වේලා ඇතිව දැන ගැනීමේ හැකියාව වර්ධනය කර ගැනීම.

ඇ. කිමිදුම් ආශ්‍රිත අනතුරු සඳහා ප්‍රතිකාර කිරීම, කිමිදුම් පුහුණුවීම් සඳහා සුදුසුකම් ලැබීමේ කිමිදුම් කටයුතු සහ ඔක්සිජන් විෂ වීමේ පරීක්ෂාව (Oxygen Toxicity Test) සිදු කිරීම සඳහා සම්පීඩන කුටීරයක් (Recompression Chamber) කිමිදුම් අංශය වෙත ලබා ගැනීමට කටයුතු සිදු කිරීම.

ඈ. ශ්‍රී ලංකා නාවික හමුදාවේ "තත්ත්වය මත නඩත්තු සිදුකිරීමේ ක්‍රමවේදය" (Condition Based Maintenance-CBM) තවදුරටත් ශක්තිමත් කිරීමට සහ සමස්ත මෙහෙයුම් ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා යන්ත්‍රෝපකරණ පරීක්ෂණ හා අත්හදා බැලීම් ඒකකය (MTTU) පුළුල් කිරීම අත්‍යවශය වේ. මෙම ව්‍යාපෘතිය මඟින් පුරෝකථන නඩත්තු හැකියාවන් (Predictive Maintenance) සැලකිය යුතු ලෙස ඉහළ යන අතර, නාවික හමුදාවේ ඇති යන්ත්‍රෝපකරණවල නඩත්තු හැකියාවන් කළමනාකරණය ක්‍රමවත්ව සිදුකරමින් මෙහෙයුම් අක්‍රිය කාලය (Downtime) අවම කරනු ඇත. මෙම පියවර මඟින් නෞකා සහ යාත්‍රාවන්හි ඉහළ ක්‍රියාකාරී සූදානම තහවුරු කරමින් ශ්‍රී ලංකා නාවික හමුදාවේ සමුද්‍රීය මෙහෙයුම් ධාරිතාවය ද ශක්තිමත් කෙරේ.

ඉ. ශ්‍රී ලංකා නාවික හමුදා පුද්ගලයින්ගේ පුහුණු කටයුතු යාවත්කාලීන කිරීම සඳහා අවශ්‍ය දැනුම මිත්‍ර නාවික හමුදාවලින් උපකාර ලබා ගැනීමෙන් නාවික පුද්ගලයින්ගේ තාක්ෂණික, පරිපාලන හා කළමනාකරණ බුද්ධිය වර්ධනය කිරීම.

ඊ. තවද, මිත්‍ර නාවික හමුදාවන් සමඟ එක්ව නාවික ක්‍රියාකාරකම් හා අභ්‍යාසයන් වැඩි වශයෙන් සිදු කිරීම තුළින් ශ්‍රී ලංකා නාවික හමුදා පුද්ගලයින්ගේ ප්‍රායෝගික හැකියාවන් වර්ධනය කර ගැනීම.

.....

ප්‍ර.ග.නි./ ග.නි./ ආයතන ප්‍රධානියා

කේඩීඩීසී ප්‍රනාන්දු, ආර්එස්පී, යූඑස්පී, ආර්සීඩීඑස්
වයිස් අද්මිරාල්
නාවික හමුදාධිපති

03 පරිච්ඡේදය

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ - එෆ්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය (වර්තමාන වර්ෂය) - 2025		සටහන	තත්‍ය		
			වර්තමාන වර්ෂය (2025) (රු)	ඉකුත් වර්ෂය (2024) (රු)	
150,000,000.00	**ආදායම් ලැබීම්**	-	**150,000,000.00**	**650,000,000.00**	
-	ආදායම් බදු	1	-	-	ඒසීඒ -1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් සහ වෙනත්	4	-	-	
150,000,000.00	**මුළු ආදායම් ලැබීම් (අ)**	**-**	**150,000,000.00**	**650,000,000.00**	
-	**ආදායම් නොවන ලැබීම්**	-	-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම	-	76,465,133,737.00	72,394,279,000.00	ඒසීඒ -3
-	තැන්පතු	-	439,291,088.00	742,246,780.00	ඒසීඒ -4
-	අත්තිකාරම් ගිණුම්	-	1,629,143,475.00	3,091,417,739.00	ඒසීඒ -5
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්	-	-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**	-	**78,533,568,299.00**	**76,227,943,519.00**	
-	**මුළු ආදායම් ලැබීම් හා ආදායම් නොවන ලැබීම් ඇ=(අ) + (ආ)**	-	**78,683,568,299.00**	**76,877,943,519.00**	
-	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)	-	**107,785,269.00**	**446,409,731.00**	
-	**ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ=(ඇ) - (ඈ)**	-	**78,575,783,030.00**	**76,431,533,788.00**	
-	අඩු කළා: වියදම	-	-	-	
-	පුනරාවර්තන වියදම්	-	-	-	ඒසීඒ - 2 (II)
41,692,848,000.00	වේතන වැටුප් සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	41,372,481,367.00	36,954,702,977.00	
31,834,900,000.00	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	30,683,963,429.00	33,515,704,912.00	
82,000,000.00	සහනාධාර, ප්‍රදාන සහ මාරු කිරීම්	7	37,627,212.00	31,305,857.00	
-	පොළී ගෙවීම්	8	-	-	
252,000.00	වෙනත් පුනරාවර්තන වියදම්	9	243,598.00	8,838,541.00	
73,610,000,000.00	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**	**-**	**72,094,315,606.00**	**70,510,552,288.00**	

-	**මූලධන ව්යදම්**	-	-	-	
9,728,000,000.00	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම්	10	5,828,101,520.00	8,479,375,732.00	
6,425,000,000.00	මූලධන වත්කම් අත්පත් කර ගැනීම	11	4,262,047,718.00	2,015,061,081.00	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
370,000,000.00	හැකියා වර්ධනය	14	339,967,029.00	244,653,733.00	
1,830,000,000.00	වෙනත් මූලධන වියදම්	15	1,590,196,974.00	1,118,880,524.00	
18,353,000,000.00	**මුළු මූලධන වියදම (උ)**	**-**	**12,020,313,242.00**	**11,857,971,070.00**	
-	තැන්පතු ගෙවීම්	-	447,406,605.00	633,392,805.00	ඒසිඒ-4
-	අත්තිකාරම් ගෙවීම්	-	1,450,396,725.00	3,082,102,497.00	ඒසිඒ- 5
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්	-	-	-	
-	**ප්‍රධාන ලෙජර් ව්යදම (ඌ)**	**-**	**1,897,803,331.00**	**3,715,495,302.00**	
-	**මුළු ව්යදම ඒ = (ඊ+උ+ඌ)**	-	**86,012,432,179.00**	**86,084,018,660.00**	
-	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ=(ඉ-ඒ)**	-	**(7,436,649,147.00)**	**(9,652,484,871.00)**	
-	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය	-	(7,443,195,306.00)	(9,652,817,381.00)	
-	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය	-	6,546,159.00	332,510.00	ඒසිඒ-3
-	-	-	(7,436,649,147.00)	(9,652,484,871.00)	

3.2 **මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය**

2025 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය	
		වර්තමාන වර්ෂය (2025) රු.	ඉකුත් වර්ෂය (2024) රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ -6	70,337,567,966.00	62,930,440,609.00
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ -5/5 (එ)	880,281,638.00	1,059,028,387.00
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ -3	6,546,159.00	332,510.00
මුළු වත්කම්		**71,224,395,763.00**	**63,989,801,506.00**
ශුද්ධ වත්කම්/ ස්කන්ධය			
භාණ්ඩාගාර වෙත ශුද්ධ වත්කම්	-	246,808,244.00	417,439,475.00
දේපළ, පිරියත හා උපකරණ සංචිතය	-	70,337,567,966.00	62,930,440,609.00
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ - 5 (බී)	-	-
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ - 4	633,473,394.00	641,588,912.00
අග්‍රීම ශේෂය	ඒසීඒ - 3	6,546,159.00	332,510.00
මුළු වගකීම්		**71,224,395,763.00**	**63,989,801,506.00**

පිටු අංක 07 සිට 31 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ අකෘතිපත්‍ර වලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 32 සිට 305 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව සිදු කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත්, මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධතිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදු කිරීමට වරින් වර සමාලෝචන සිදු කරන බවත් මෙයින් සහතික කරමු.

.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරී

නම්:
තනතුර:
දිනය: 27.02.2026

Air Vice Marshal Sampath Thuyacontha (Retd)
WWV RWP// RSP/ USP fndu psc
Secretary
Ministry of Defence

.....
ගණන්දීමේ නිලධාරී

නම්:
තනතුර:
දිනය: 24.02.2026

BAKSP BANAGODA, RSP, USP, ndc, psc
Vice Admiral
Commander of the Navy

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී/අධ්‍යක්ෂ (මූල්‍ය)/ කොමසාරිස් (මූල්‍ය)
නම්:
දිනය: 24.02.2026

U.G.R. DAMAYANTHI
DIRECTOR (FINANCE)
SRI LANKA NAVY

3.3 **මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය**

ඒසිඒ - සී

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන
මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

	තත්‍ය	
	වර්තමාන වර්ෂය (2025) රු.	**ඉකුත් වර්ෂය (2024) රු.**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මූළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩ මුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	150,000,000.00	-
වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	2,910,662,476.73	3,468,410,352.99
අග්‍රිම ලැබීම්	76,465,133,736.80	72,394,279,000.00
අත්තිකාරම් අයකර ගැනීම	1,623,425,607.72	3,090,284,740.00
තැන්පතු ලැබීම්	439,291,087.65	742,246,780.00
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**81,588,512,908.90**	**79,695,220,872.99**
අඩු කළා - මුදල් වැය කිරීම්:		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	65,662,635,838.09	61,756,112,008.00
සහනාධාර සහ මාරු කිරීම්	37,627,211.65	40,144,399.00
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම, මූලධන මාරුකිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම්	6,997,487,234.35	-
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	2,633,212,461.29	2,899,314,657.00
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	107,785,268.59	446,409,731.00
අත්තිකාරම් ගෙවීම්	1,441,947,976.47	3,081,305,968.00
තැන්පතු ගෙවීම්	447,406,605.25	633,392,805.00
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**77,328,102,595.69**	**68,856,679,568.00**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**4,260,410,313.21**	**10,838,541,304.99**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම	-	-
අත්තිකාරම් අයකර ගැනීම	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩු කළා - මුදල් වැය කිරීම්:		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්	4,253,864,154.21	10,838,208,795.00
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	4,253,864,154.21	10,838,208,795.00
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(4,253,864,154.21)**	**(10,838,208,795.00)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	6,546,159.00	332,509.99

මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
තැන්පතු ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩු කළා - මුදල් වැය කිරීම්:		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
තැන්පතු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල් වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) +(ඒ)	**6,546,159.00**	**332,509.99**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**6,546,159.00**	**332,509.99**

3.4 **මූල්‍ය ප්‍රකාශ සටහන්**

අ. **වාර්තා කිරීමේ පදනම**

(1) **පිළියෙල කිරීමේ අරමුණ**

මූල්‍ය ප්‍රකාශන,රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් මස 17 වන දිනැති රජය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

(2) **වාර්තාකරණ කාල පරිච්ඡේදය**

2025 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාල පරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාල පරිච්ඡේදය වේ.

(3) **මිනුම්කරණ පදනම**

(අ) මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර, සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදු කරයි.

(ආ) මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

(4) **ආදායම් හඳුනා ගැනීම**

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාල පරිච්ඡේදයේ දී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

(5) **දේපළ, පිරියත හා උපකරණ හඳුනා ගැනීම හා මැනීම**

(අ) වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

(ආ) දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර, පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවල දී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

(6) **<u>දේපළ, පිරියත හා උපකරණ සංචිතය</u>**

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

(7) **<u>මුදල් හා මුදල් සමාන දෑ</u>**

(අ) 2025 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

(ආ) යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදු කර ගත හැක. එසේම "වාර්තාකිරීමේ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

(ඇ) තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

3.5 **<u>ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය</u>**

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව (රු)		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
2001.03.00	ගබඩා අත්තිකාරම් ගිණුම (පුපුරණ ද්‍රව්‍ය)	150,000,000.00	150,000,000.00	150,000,000.00	-

3.6 **<u>වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය</u>**

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන (රු)		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ක් ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	73,210,000,000.00	73,610,000,000.00	72,094,315,605.00	98%
ප්‍රාග්ධන	19,353,000,000.00	18,353,000,000.00	12,020,313,242.00	65%

3.7 **මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන**

අ:අං	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම (රු)	උපයෝගී කරගනු ලැබූ ප්‍රතිපාදන, අවසාන කරන ලද අවසන් ප්‍රතිපාදන ප්‍රමාණයේ % ක් ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන (රු)		
1	ආරක්ෂක අමාත්‍යාංශය	රණවිරු මාපිය රැකවරණ දීමනාව	363,586,500.00	339,750.00	363,246,750.00	100%
		ජාතික ජලශාස්ත්‍රීය කාර්යාලය	59,500,000.00	49,207,750.36	10,292,249.64	17%
		සන්නිවේදන මධ්‍යස්ථාන රේඩියෝ උපකරණ කාමර ඉදිකිරීම	5,311,447.96	4,192,271.55	1,119,176.41	21%
2	වැටුප් සහ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව	රණවිරු දුබලතා දීමනාව	1,707,900,000.00	24,142,828.28	1,683,757,171.72	99%
3	සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය	රිජ්වේ ආර්යා ළමා රෝහලේ හෘද හා බරපතල රෝග සත්කාර සංකීර්ණය ඉදිකිරීම	1,533,692,418.11	1,103,842,759.35	429,849,658.76	28%
4	අධ්‍යාපන අමාත්‍යාංශය	කුරුණෑගල ආරක්ෂක සේවා විද්‍යාලය	160,000,000.00	56,067,856.09	103,932,143.91	65%
		කොළඹ ආරක්ෂක සේවා විද්‍යාලය නවීකරණය කිරීම	859,099.00	697,970.00	161,129.00	19%
5	සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව	ජාතික කලාභවන ඉදිකිරීම	119,000,000.00	93,470,657.56	25,529,342.44	21%
6	වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව	වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවට අයත් යාත්‍රා අලුත්වැඩියා කිරීම	37,227,099.85	103,361.76	37,123,738.09	100%
7	බන්ධනාගාර දෙපාර්තමේන්තුව	පල්ලන්සේන බන්ධනාගාරය වැඩිදියුණු කිරීම	4,803,800.00	1,025,000.00	3,778,800.00	79%
8	නාගරික සංවර්ධන අධිකාරිය	පාර්ලිමේන්තු සංකීර්ණ භූමිය නැවත සකස් කිරීම	2,279,926.52	150,936.49	2,128,990.03	93%
9	රාජ්‍ය බුද්ධි සේවය ත්‍යාග අරමුදල්	රාජ්‍ය බුද්ධි සේවා බෝඹුරු ඇල්ල පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකිරීම	2,507,239.76	924,734.16	1,582,505.60	63%
10	පොලිස් දෙපාර්තමේන්තුව	පොලිස් මත්ද්‍රව්‍ය නාශක වනාතවිල්ලුව ගොඩනැගිල්ල	885,055.78	287,326.03	597,729.75	68%
		පොලිස්පති නිල නිවසේ රාජකාරී නියුතු නිලධාරීන් සඳහා නව භට නිවාසයක් ඉදි කිරීම	2,674,217.93	2,151,249.33	522,968.60	20%
11	මාර්ග සංවර්ධන අධිකාරිය උතුරු පළාත	වඩතාරකී මගී යාත්‍රාව නවීකරණය කිරීම	50,694,235.61	50,694,235.61	-	0%
12	පරිසර අමාත්‍යාංශය	කඩොලාන සංරක්ෂණ ව්‍යාපෘතිය	2,523,395.00	826,135.69	1,697,259.31	67%
13	මධ්‍යම සංස්කෘතික අරමුදල්	ෂෙන්ග් හේ ව්‍යාපෘතිය	24,278,897.21	266,190.03	24,012,707.18	99%

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

වත්කම් කේතය	කේත විස්තරය	**2025.12.31** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	**2025.12.31** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	10,091,840,080.73	10,091,840,080.73	-	100%
9152	යන්ත්‍රෝපකරණ	55,649,662,542.89	55,649,662,542.89	-	100%
9153	ඉඩම්	2,785,263,725.00	2,785,263,725.00	-	100%
9154	අස්පෘශ්‍ය වත්කම්	1,239,102.81	1,239,102.81	-	100%
9155	ජීව විද්‍යාත්මක වත්කම්	2,537,000.00	2,537,000.00	-	100%
9160	කෙරීගෙන යන වැඩ	1,812,099,514.78	1,812,099,514.78	-	100%
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද අවසාන විගණන සම්පිණ්ඩන වාර්තාව සහ එම නිරීක්ෂණයන් සම්බන්ධයෙන් ප්‍රකාශය ඇතුළත්ව ඉදිරිපත් කර ඇති වාර්තාව පරිලෝකනය කොට මෙම වාර්තාව අවසානයේ අන්තර්ගත කොට ඇත.

04 පරිච්ඡේදය
කාර්යසාධන දර්ශක

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුම් ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම				වෙනත් කරුණු
	90% - 100%	89% - 75%	50% - 74%	49% - 10%	
අධ්‍යක්ෂ ජෙනරාල් ඉංජිනේරු					
වේව්රයිඩර් වර්ගයේ වෙරළාරක්ෂක මුර යාත්‍රා 03ක් තැනීම-2023 වර්ෂය සඳහා	-	81.49%	-	-	-
වේව්රයිඩර් වර්ගයේ වෙරළාරක්ෂක මුර යාත්‍රා 03ක් තැනීම-2024 වර්ෂය සඳහා	-	-	-	27.33%	-
අඩි 18ක් දිගැති ෆයිබර් ග්ලාස් ඩිංගි යාත්‍රා 20ක් තැනීම	95.20%	-	-	-	-
ශ්‍රී ලංකා නාවික හමුදාව සතු යන්ත්‍රෝපකරණ සහ පරීක්ෂණ සහ අත්හදා බැලීමේ ඒකකය පුළුල් කිරීම	-	88.29%	-	-	-
ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත අත්පත් කර ගැනීමට නියමිත දියමත පාවෙන තඨාකාංගණයට සමගාමීව ත්‍රිකුණාමලය නාවික තඨාකාංගණයේ තාක්ෂණික වැඩපලවල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම	-	84.22%	-	-	-
අධ්‍යක්ෂ ජෙනරාල් සිවිල් ඉංජිනේරු					
ගොඩනැගිලි හා ව්‍යුහ ඉදිකිරීම	93.8%	-	-	-	-
ගොඩනැගිලි හා ව්‍යුහ ප්‍රතිසංස්කරණය කිරීම	92.1%	-	-	-	-
යටිතල පහසුකම් සංවර්ධනය කිරීම	95.4%	-	-	-	-
ත්‍රිකුණාමලය නාවික තඨාකාංගණයේ ජැටිය ඉදිකිරීම	97.7%	-	-	-	-
ත්‍රිකුණාමලය නාවික හා සාගරික විද්‍යාපීඨයෙහි ඉදිකිරීම් කටයුතු - දෙවන අදියර	100%	-	-	-	-
අධ්‍යක්ෂ ජෙනරාල් සෞඛ්‍ය සේවා					
ශ්‍රීලංනානෞ රුහුණු ආයතනයෙහි මහල් 03කින් සමන්විත පරිපාලන ගොඩනැගිල්ලෙහි තෙවන මහලේ ගිලන්හල ස්ථාපිත කිරීම	100%	-	-	-	-
නාවික රෝහල නිපුණහි නේවාසික ප්‍රතිකාර ලබන කාන්තා රෝගීන්හට සුදුසු තත්වයේ ඇති කාන්තා වාට්ටු සංකීරණයක් ඉදිකිරීම	100%	-	-	-	-
අධ්‍යක්ෂ ජෙනරාල් පුහුණු					

විදේශීය පුහුණු	91%	-	-	-	-
දේශීය පුහුණු (අභ්‍යන්තර)	91.46%	-	-	-	-
දේශීය පුහුණු (බාහිර)	-	-	66.46%	-	-
නාවික විභාග හා විෂය නිර්දේශ	100 %	-	-	-	-
අධ්‍යක්ෂ ජෙනරාල් මෙහෙයුම්					
මෙහෙයුම් උපකරණ මිලදී ගැනීම	-	-	67.5%	-	-
අධ්‍යක්ෂ ජෙනරාල් විදුලි හා විද්‍යුත්					
ප්‍රාග්ධන වත්කම්, යන්ත්‍රෝපකරණ සහ උපකරණ අලුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම සහ වැඩි දියුණු කිරීම	-	-	-	19.78%	අනුමත කරන ලද මුදල - රු.මි. 2,328.14 වැය කරන ලද මුදල - රු.මි. 1,269.82 සත්‍යාපනය කරන ලද මුදල - රු.මි. 460.61
ප්‍රාග්ධන වත්කම්, යන්ත්‍රෝපකරණ සහ උපකරණ අත්පත් කර ගැනීම	-	-	-	9.85%	අනුමත කරන ලද මුදල - රු.මි. 296.00 වැය කරන ලද මුදල - රු.මි. 156.18 සත්‍යාපනය කරන ලද මුදල - රු.මි. 29.18
නෞකාවල පාවිච්චි කරන පැරණි විදුලි හා විද්‍යුත් පද්ධති සහ උපකරණ, යන්ත්‍රෝපාංග නවීකරණය කිරීම	-	-	-	20.74%	අනුමත කරන ලද මුදල - රු.මි. 100.00 වැය කරන ලද මුදල - රු.මි. 75.81 සත්‍යාපනය කරන ලද මුදල - රු.මි. 20.74
සංකේත රහිත ඉතා උච්ච සංඛ්‍යාත සන්නිවේදන ජාල පද්ධතීන් නවීකරණය කිරීම	-	-	64.51%	-	අනුමත කරන ලද මුදල - රු.මි. 75.00 වැය කරන ලද මුදල - රු.මි. 85.66 සත්‍යාපනය කරන ලද මුදල - රු.මි. 48.38
ක්ෂුද්‍ර තරංග සන්නිවේදන ජාලය නවීකරණය කිරීම	-	-	-	7.27%	අනුමත කරන ලද මුදල - රු.මි. 150.00 වැය කරන ලද මුදල - රු.මි. 122.89 සත්‍යාපනය කරන ලද මුදල - රු.මි. 10.91
අභ්‍යන්තර දුරකථන හුවමාරු ඒකක සහ පරිපාලන ජාලය නවීකරණය කිරීම	-	-	-	4.10%	අනුමත කරන ලද මුදල - රු.මි. 50.00 වැය කරන ලද මුදල - රු.මි. 49.61 සත්‍යාපනය කරන ලද මුදල - රු.මි. 2.05

ප්‍රධාන ජලශාස්ත්‍රීය සේවා					
නව මිණුම් උපකරණ සහ අමතර කොටස් මිලදී ගැනීම		-	-	32.62%	ශ්‍රී ලංකා නාවික හමුදා ජලශාස්ත්‍රීය සේවය විසින් 2025 වර්ෂයේ රු.මි. 20 ප්‍රසම්පාදන කටයුතු සම්පූර්ණ කළ අතර, ඒ සඳහා වූ මිලදීගැනීමේ ඇණවුම් නිකුත් කරන ලදී. වර්ෂ අවසානයේ ප්‍රසම්පාදන කටයුතු සඳහා වූ සීමිත කාලය සහ දේශීය වෙළඳපලේ ඇතැම් අයිතම නොමැති වීම හේතුවෙන් සැපයුම් කරුවන්හට නියමිත කාලය තුළ අයිතමයන් සපයා දීමට නොහැකි විය. එහි ප්‍රතිඵලයක් ලෙස අපේක්ෂිත ප්‍රසම්පාදන ඉලක්ක සපුරා ගැනීමට නොහැකි විය
අධ්‍යක්ෂ ජෙනරාල් සැපයුම් හා සේවා					
මිලදී ගැනීම් (වැය ශීර්ෂ 2102)	100%	-	-	-	-
මිලදී ගැනීම් (වැය ශීර්ෂ 2103)	-	-	60%	-	-
ආහාර හා නිල ඇඳුම්					
ආහාර	95.08%	-	-	-	-
නිල ඇඳුම්	91.30%	-	-	-	-
විදේශීය මිලදී ගැනීම්					
මිලදී ගැනීම් (වැය ශීර්ෂ 2103)	-	-	-	22.34%	-
මිලදී ගැනීම් (වැය ශීර්ෂ 1205)	-	78.88%	-	-	-
මිලදී ගැනීම් (වැය ශීර්ෂ 2002)	-	-	51.71%	-	-

05 පරිච්ඡේදය

තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනාගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු.

යටිතල පහසුකම් ගොඩනැගීම, තිරසාර කාර්මිකරණය ප්‍රවර්ධනය කිරීම සහ නවෝත්පාදනයන් පෝෂණය කිරීම.

ක්ලීන් ශ්‍රී ලංකා ව්‍යාපෘතිය					
ජගත් පරිසර දිනය නිමිත්තෙන් ත්‍රිකුණාමලය නිලාවේලි පරවි දූපත ආශ්‍රිතව කොරල්පර ප්‍රදේශයේ මුහුදු පතුළ පිරිසිදු කිරීමේ කාර්ය සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවේ කිමිදුම්කරුවන්ගේ දායකත්වය ලබාදීම	-	-	-	-	-
කුබිව්වන් කුලම වැව - අනුරාධපුර, කරවිට වැව- හලාවත, කලා වැව - අනුරාධපුර යන වැව් 3ක් පිරිසිදු කිරීමේ කාර්යය සඳහා දායකත්වය ලබාදීම	-	-	-	-	-
දිවයින පුරා පාසැල් වල ඩෙංගු මර්ධන වැඩසටහන් පැවැත්වීම	-	-	-	-	-
‘ක්ලීන් ශ්‍රී ලංකා’ පාපැදි සවාරිය සඳහා ශ්‍රී ලංකා නාවික හමුදා පාපැදි කරුවන් සහභාගි කරවීම	-	-	-	-	-
කඩුවෙල නගරයේ සිදු කළ ‘ක්ලීන් ශ්‍රී ලංකා’ ශ්‍රමදාන වැඩසටහන සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවේ දායකත්වය ලබාදීම	-	-	-	-	-
දිවයින වටා වෙරළ තීර පිරිසිදු කිරීම සඳහා නාවික හමුදා සාමාජිකයින් සහභාගි කරවීම	-	-	-	-	-
ගාලු කොටුව පිරිසිදු කිරීම සඳහා දායකත්වය ලබාදීම	-	-	-	-	-
‘හදවතින් යාපනය’ වැඩසටහන යටතේ සංගීත රසාස්වාද වැඩසටහන සඳහා නාවිකයන් සහභාගී කරවීම	-	-	-	-	-
පළාත් පාලන සතිය වෙනුවෙන් ‘ක්ලීන් ශ්‍රී ලංකා’ ව්‍යාපෘතිය යටතේ සිදු කළ වැඩසටහන් සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවේ දායකත්වය ලබාදීම	-	-	-	-	-
‘ක්ලීන් ශ්‍රීලංකා’ ව්‍යාපෘතිය යටතේ රාගම දුම්රිය ස්ථානය පිරිසිදු කිරීමේ වැඩසටහන සඳහා නාවික හමුදාව දායකත්වය ලබාදීම	-	-	-	-	-
තබ්බෝව ජලාශය ආශ්‍රිතව අලි සුපෝෂණ කලාපයක් නිර්මාණය කිරීම සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවේ දායකත්වය ලබාදීම	-	-	-	-	-
ගිංතොට ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයට අයත් ඩිපෝව පරිශ්‍රය පිරිසිදු කිරීම සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවේ දායකත්වය ලබාදීම	-	-	-	-	-
අධිකරණ සංකීර්ණවල ගොඩගැසී ඇති නඩු භාණ්ඩ නිෂ්කාශනය කිරීමේ වැඩසටහන සඳහා නාවික හමුදාවේ යන්ත්‍ර සූත්‍ර සහ දායකත්වය ලබාදීම	-	-	-	-	-
ගාල්ල උණගස්වෙල කනිෂ්ඨ විද්‍යාලයේ පාසල් පරිශ්‍රය පවිත්‍ර කරීම සඳහා දායකත්වය ලබාදීම	-	-	-	-	-
වැලිගම කප්පරතොට වෙරළ තීරය පිරිසිදු කිරීම සඳහා දායකත්වය ලබාදීම	-	-	-	-	-
බස්නාහිර පළාත තුළ ඇතිවූ ගංවතුර තත්ත්වය හේතුවෙන් අපවිත්‍ර වූ ළිං 483ක් පිරිසිදු කිරීමේ කටයුතු සඳහා නාවික හමුදාවේ දායකත්වය ලබාදීම	-	-	-	-	-
‘දිවිවා’ සුළි කුණාටුව හේතුවෙන් ආපදාවට පත් දොළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කලෙයිවාන විදුහලේ අවතැන් ජනතාව වෙනුවෙන් පැවැත් වූ සෞඛ්‍ය කඳවුර සඳහා නාවික හමුදා වෛද්‍ය කණ්ඩායමක් සහභාගී කරවීම	-	-	-	-	-
‘දිවිවා’ සුළි කුණාටුවෙන් විනාශවූ බදුල්ල දිස්ත්‍රික්කයේ පාසල් හා පෙර පාසල් නැවත පිළිසකර කිරීමේ සතියක වැඩසටහන සඳහා නාවික හමුදාවේ 100ගෙන් යුත් භට කණ්ඩායමක දායකත්වය ලබාදීම	-	-	-	-	-
‘දිවිවා’ සුළි කුණාටුවෙන් ශ්‍රී පාදස්ථානය වෙත ගමන් ගන්නා මාර්ගයේ මහගිරිදඹ ප්‍රදේශයේ ආපදාවට පත් පියගැටපෙළ අලුත්වැඩියාවන් සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ඉහළට ගෙනයාම සඳහා නාවික හමුදාවේ 200කින් යුත් නාවික පුද්ගලයින්ගේ දායකත්වය ලබාදීම	-	-	-	-	-

<u>අභ්‍යන්තර කටයුතු ඒකකය</u>					
නාවික හමුදාවේ දූෂණය අවම කිරීම	අභ්‍යන්තර කටයුතු ඒකකයක් පිහිටුවීම	-	-	-	100%
	දූෂණ අවදානම් තක්සේරු කිරීමේ වාර්තාවන් (CRA) සකස් කිරීම	-	-	-	100%
	ආයතනික සුපිළිපන් ක්‍රියාකාරී සැලැස්මක් (IIAP) සකස් කරීම	-	-	-	100%
අල්ලස් හා දූෂණය අවම කිරීම සම්බන්ධව නාවික පුද්ගලයින් දැනුවත් කිරීම	දූෂණ හා අල්ලස් සම්බන්ධ පුහුණු පංති පැවැත්වීම	-	-	-	75%
අල්ලස් හා දූෂණ සම්බන්ධ පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා ක්‍රමවේදයන් හඳුන්වාදීම	අල්ලස් හා දූෂණ පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා දුරකථන අංකයක් සහ Whatsapp අංකයක් හඳුන්වාදීම	-	-	-	100%
	අල්ලස් හා දූෂණ පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා විද්‍යුත් ලිපිනයක් හඳුන්වා දීම	-	-	-	100%
	අල්ලස් හා දූෂණ පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා QR කේතය හඳුන්වාදීම	-	-	-	100%
<u>මෙහෙයුම් (නාවික පාබල)</u>					
ශ්‍රී ලංකාව තුළ අභ්‍යන්තර ආරක්ෂාව සැපයීම සහ කැරලි මර්ධන මෙහෙයුම් සිදු කිරීම මෙන්ම වරායන් සඳහා ආරක්ෂාව සැපයීමට සහය වීම, නීති විරෝධී අවි ආයුධ, මත්ද්‍රව්‍ය ජාවාරම් හා නීති විරෝධී ධීවර කටයුතු මැඩ පැවැත්වීම, පුපුරණ ද්‍රව්‍ය බැහැර කිරීමේ මෙහෙයුම් සිදු කිරීම	සියලුම නාවික විධාන තුළ විසිරී සිටින ගවේශනාත්මක කාර්ය සාධක බලකාය සහ නාවික පාබල අංශයේ හට පිරිස් යොදා ගනිමින් සහ විශේෂ බුද්ධි තොරතුරු පදනම් කරගනිමින් අපේක්ෂිත ඉලක්ක හා අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මෙහෙයුම් සිදු කිරීම	පාමුර සංචාර, වෙරළ බඩ මුර සංචාර යෙදවීම, නිරීක්ෂණ මෙහෙයුම් වැනි විශේෂිත ආරක්ෂක ක්‍රියාමාර්ගයක්	-	-	75%
		නිශ්චිත බුද්ධි තොරතුරු මත පදනම් වූ මෙහෙයුම්	-	-	85%
ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් පවත්වනු ලබන විශේෂ අවස්ථා, උත්සව සහ නිල උත්සව සඳහා සහභාගී වන දේශීය හා විදේශීය නියෝජිතයින්ට VIP/ VVIP ආරක්ෂාව සැපයීම, සම්බන්ධීකරණය සහ ආරක්ෂක පියවර ක්‍රියාත්මක කිරීම තුළින් ආරක්ෂිත, සුරක්ෂිත සහ ගෞරවනීය පරිසරයක් සහතික කිරීම	ශ්‍රී ලංකා නාවික හමුදාව සංවිධානය ලබන ප්‍රභූ පුද්ගල සංචාර සහ උත්සව අවස්ථාවන් සඳහා ඉහළම මට්ටමේ ආරක්ෂාව සහතික කිරීම	වට ආරක්ෂාව, ස්ථානීය ආරක්ෂාව සැපයීම, පෙර ගමන් රථ සහ පුද්ගලික ආරක්ෂක නිලධාරීන් යෙදවීම තුළින් ප්‍රභූ ආරක්ෂක රාජකාරීන් සිදු කිරීම	-	-	100%
නවීන තාක්ෂණික ක්‍රම සංවර්ධනය කිරීම තුළින් අනාගත නාවික ගොඩබිම් මෙහෙයුම් වැඩිදියුණු කිරීම	තාක්ෂණික වශයෙන් ප්‍රවීණ නාවික පාබල අංශයේ නිලධාරීන් සහ නාවිකයින් සංවර්ධනය කිරීම සඳහා පුළුල් පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම මඟින් නියමුවන් රහිත ගුවන් යානා පද්ධති එලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය දැනුම සහ කුසලතා ඔවුන් වෙත ලබා දීම හා මෙම හැකියාවන් වැඩිදියුණු කර වෙරළබඩ නිරීක්ෂණ, ගලවා ගැනීමේ මෙහෙයුම් සඳහා වේගවත් ප්‍රතිචාර ලබා දීමේ සහාය කන්ඩායම් සූදානම් කිරීම හා වැඩි ප්‍රදේශයක් ආවර්ණය කිරීම මඟින් එලදායී මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම	ඩ්‍රෝන ක්‍රියා කරවීම සම්බන්ධ පාඨමාලාවන් හඳුන්වා දීම සහ පැවැත්වීම	-	60%	-

මත්ද්‍රව්‍ය සහ පුපුරණ ද්‍රව්‍ය හඳුනාගැනීමේ මෙහෙයුම් සඳහා සුනඛ සංචිතයේ සහාය ලබා දීම	සමුද්‍රීය ආරක්ෂාව, වරාය සහ කඳවුරු ආරක්ෂාව, වෙරළබඩ නිරීක්ෂණ සහ විශේෂ නාවික මෙහෙයුම් සඳහා සහාය වීම සඳහා සුනඛ කණ්ඩායම් ක්‍රමානුකූල පුහුණු කිරීම සහ යෙදවීම තුළින් මත්ද්‍රව්‍ය සහ පුපුරණ ද්‍රව්‍ය හඳුනාගැනීමේ මෙහෙයුම් සඳහා ඵලදායී සහාය ලබා දීම	අවශ්‍ය සහාය ලබා දීම සඳහා නාවික විධානයන්හි සුනඛ ඒකක පහසුකම් සහ පුහුණු කිරීම සංවර්ධනය කිරීම	-	60%	-
ආපදා ප්‍රතිචාර මෙහෙයුම් සඳහා ගවේෂණාත්මක කාර්ය සාධක බලකායේ නාවිකයින් සැපයීම	සිවිල් ජනතාව හදිසි සහ ආපදා තත්ත්වන්ට මුහුණ දුන් අවස්ථාවකදී ඵලදායී ලෙස එයට ප්‍රතිචාර දැක්වීම සඳහා ETF ඒකකවල මෙහෙයුම් හැකියාවන් වර්ධනය කිරීම	හදිසි අවස්ථා වලදී නිශ්චිත කාලයක් තුළ හදිසි අවස්ථාවන් සඳහා යෙදවීමේ හැකියාව සහිතව ETF කණ්ඩායම් ඉහළ සූදානමකින් පවත්වා ගැනීම	-	60%	-
<u>**මැරීන් බලකාය**</u>					
රටේ ජාතික ආරක්ෂාව තහවුරු කිරීම උදෙසා වෙරළ තීරයේ සහ ආසන්න මුහුදු තීරයේ ආරක්ෂාව තර කිරීම මෙන්ම තහනම් ධීවර කටයුතු, මත්ද්‍රව්‍ය ජාවාරම්, නීති විරෝධී මිනිස් ජාවාරම්, තහනම් ද්‍රව්‍ය මුහුදු මඟින් ප්‍රවාහනය කිරීම වැළැක්වීම සහ ආර්ථික මරමස්ථාන සඳහා අවශ්‍ය ආරක්ෂාව සැපයීම	නාවික විධානයන් වෙත අනියුක්ත කර සිටින මැරීන් අංශයට අයත් මැරීන් නාවික පුද්ගලයින් විසින් වෙරළ තීරයේ සහ ආසන්න මුහුදු තීරයේ සිදු කරන මෙහෙයුම් සහ ආර්ථික මරමස්ථාන සහ ආරක්ෂා කිරීම මඟින් රටේ ජාතික ආරක්ෂාව තහවුරු කිරීම	2025 ජනවාරි 01 වන දින සිට දෙසැම්බර් 31 වන දින දක්වා මැරීන් අංශයට අයත් නාවික පුද්ගලයින් විසින් දිවයින වටා පිහිටි වෙරළ තීරය සහ ආසන්න මුහුදු තීරයේ දෛනික මෙහෙයුම් සහ බුද්ධි තොරතුරු මත පදනම්ව සිදු කරනු ලැබූ මෙහෙයුම් මඟින් පහත සඳහන් පරිදි නීති විරෝධී කටයුතුවල නියලුනු පුද්ගලයින්, නීති විරෝධී භාණ්ඩ සහ එයට සම්බන්ධවූ යාත්‍රාවන් අත්අඩංගුවට ගැනීම අ. පුද්ගලයින් - 102 ආ. ඩිංගි යාත්‍රා - 65 ඇ. බීඩි කොළ - 16700.25 කිලෝ ඈ. කේරල ගංජා - 1012.53 කිලෝ	-	-	75 %
ශ්‍රී ලංකාව වෙත පැමිණෙන විදේශීය යුද නෞකාවන් සඳහා ආරක්ෂාව සැපයීම	ශ්‍රී ලංකාවේ පිහිටි වරායන් වෙත පැමිණෙන විදේශීය යුද නෞකා සහ එම නෞකා නැංගුරම්ලා තිබෙන ජැටි වෙත ගොඩබිම් ආරක්ෂාව සැපයීම	2025 වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ විවිධ වරායන් වෙත පැමිණි යුධ නෞකා 35 ක් වෙත අදාළ ආරක්ෂාව සහ එම නෞකා නැංගුරම්ලා තිබූ ජැටි වෙත කිසිදු ගැටළුවක් ඇති නොවන ආකාරයෙන් ගොඩබිම් ආරක්ෂාව සැපයීම	-	-	80%
2030 නාවික උපායමාර්ගික සැලැස්මට අනුව නව තාක්ෂණය මැරීන් බලඇණිය වෙත හඳුන්වා දීම මඟින් මැරීන් බලඇණිය විසින් සිදු කරනු ලබන මුහුදු හා ගොඩබිම් මෙහෙයුම්වල ඵලදායීතාව වැඩි කිරීම	2030 වර්ෂය වන විට නාවික උපාය මාර්ගික සැලැස්මට අනුව මැරීන් නාවික පුද්ගලයින් වෙත ඩ්‍රෝන සහ ශරීර කැමරා ලබා දීම සහ ඒ සම්බන්ධව න්‍යායාත්මක සහ ප්‍රායෝගික දැනුම ලබා දීම මඟින් ඵලදායී ලෙස මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම	ඩ්‍රෝන සහ ශරීර කැමරා මිලදී ගැනීමට අවශ්‍ය ක්‍රියාකාරකම් සිදු කිරීම සහ එයට සමගාමීව මෙම තාක්ෂණික උපකරණ භාවිතය සම්බන්ධයෙන් අවශ්‍ය න්‍යායාත්මක සහ ප්‍රායෝගික දැනුම මැරීන් බලඇණියට අනියුක්ත රාජකාරී සිදු කරන නාවික පුද්ගලයින් 06ක් සඳහා ලබා දීම	40 %	-	-

මැරීන් බල ඇණියට අයත් බෝම්බ නිෂ්ක්‍රිය අංශයේ නාවික පුද්ගලයින් සහ ඉව කරන සුනඛයින් මඟින් පුපුරණ ද්‍රව්‍ය සහ මත්ද්‍රව්‍ය සොයා ගැනීම සඳහා අවශ්‍ය සහය ලබා දීම	සමුද්‍රීය ආරක්ෂාව, වරාය, නාවික කඳවුරු ආරක්ෂාව සහ විශේෂ මෙහෙයුම් සඳහා මැරීන් බෝම්බ නිෂ්ක්‍රිය නාවික පුද්ගලයින්ගේ සහ සුනඛ කණ්ඩායම් වල සහය ලබා දීම තුලින් මත්ද්‍රව්‍ය සහ පුපුරණ ද්‍රව්‍ය හඳුනා ගැනීමේ මෙහෙයුම් සඳහා දායකත්වය ලබා දීම	මෙම වසර තුළදී මෙරට වරායන් වෙත පැමිණි යුධ නෞකා 35ක් අදාළ වරායන් වෙත පිවිසිමට පෙර බෝම්බ නිෂ්ක්‍රිය නාවික පුද්ගලයින් සහ ඉව කරන සුනඛයින් යොදවා එම වරායන් හී ආරක්ෂාව තහවුරු කිරීම සහ මුහුදු මාර්ග ඔස්සේ මත්ද්‍රව්‍ය ප්‍රවාහනය කර අත්අඩංගුවට ගත් යාත්‍රා පරීක්ෂා කිරීම සඳහා සුනඛ කණ්ඩායම් යොදා ගැනීම	40%	-	-
මැරීන් බල ඇණියේ නාවික පුද්ගලයින් විසින් රටතුළ ඇති වන ව්‍යසන තත්වයකදී ඒ සඳහා අවශ්‍ය සහය ලබා දීම	රට තුළ ඇතිවන ව්‍යසන තත්වයකදී මැරීන් බලඇණියෙ සතුව පවතින මානව සහ භෞතික සම්පත් උපයෝගී කර ගනිමින් එම ව්‍යසන තත්වයට සාර්ථකව මුහුණ දීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග සිදු කිරීම	මෙම වසර තුළ මෙරට සිදුවූ ගංවතුර ගැලීම් සහ විශේෂයෙන්ම පසුගිය කාලසීමාව තුළ ඇති වූ 'දිට්වා' සුළු කුණාටුව හේතුවෙන් ආපදාවට ලක් වී අවතැන් වූ පුද්ගලයින් සඳහා අවශ්‍ය සහය ලබා දීම සහ එහිදී පහත සඳහන් පරිදි මුදුවා ගැනීම් කටයුතු සිදු කිරීම අ. කොලොන්නාව - 14 ආ. අඹතලේ - 74 ඇ. අංගොඩ - 19 ඈ. පොළොන්නරුව - 112 (පුදුර් සහ ගල්ලැල්ල ප්‍රදේශ) ඉ. මූතූර් - 359 (ලිංගපුර ප්‍රදේශය)	-	70%	-
<u>නාවික මෙහෙයුම්</u>					
නීති විරෝධී ධිවර ක්‍රියාකාරකම් වැළැක්වීම	නීති විරෝධී ලෙස ධිවර කටයුතු වල නියැලෙන පුද්ගලයින් සහ යාත්‍රා අත්අඩංගුවට ගැනීම	නීති විරෝධී ලෙස ධිවර කටයුතු සිදු කරනු ලබන පුද්ගලයින් හා යාත්‍රා අත්අඩංගුවට ගැනීම 2025.01.01. සිට 2025.12.31 දක්වා	-	-	-
		ට්‍රෝලර් යාත්‍රා මෙරට - 24			
		ට්‍රෝලර් යාත්‍රා (ඉන්දියන්) - 44			
		ඩිංගි යාත්‍රා - 377			
		වල්ලම් - 09			
		නීති විරෝධී දැල් ආම්පන්න - 3051			
		අත්අඩංගුවට ගත් පුද්ගලයින් මෙරට - 1117			
		අත්අඩංගුවට ගත් පුද්ගලයින් (ඉන්දියන්) - 346			
<u>නාවික බුද්ධි මෙහෙයුම්</u>					
නීති විරෝධී අවි ආයුධ ජාවාරම වැළැක්වීම	අවි ආයුධ අත්අඩංගුවට ගැනීම සහ සොයා ගැනීම	දේශීය නිෂ්පාදිත ගිනි අවි - 07	-	-	-
		අත් බෝම්බ - 18			
		7.62 x 54 මිමී ජීව උණ්ඩ - 06			
		7.62 x 39 මිමී ජීව උණ්ඩ - 1648			
		කොටන තුවක්කු උණ්ඩ - 10			
		60 මිමී මෝටාර් බෝම්බ - 04			
		තමිල් ගුණ්ඩු - 03			
		බෝර 12 ගිනි අවි - 01			
		ඒපී බෝම්බ - 02			
		ආටිලරි හිස් පතුරම් - 01			
		පැති අවි - 04			
		පැති අවි පතුරම් (ගැබ්) - 04			
		7.65 මිමී පැති අවි ජීව උණ්ඩ - 40			
		පූවස් - 01			
		ක්ලේමෝ බෝම්බ කවර - 01			
		අත්අඩංගුවට ගත් පුද්ගලයින් - 37			

මත්ද්‍රව්‍ය ජාවාරම ක්‍රියාත්මක වීම වැළැක්වීම	මත්ද්‍රව්‍ය වැටලීම් සිදු කිරීම	හෙරොයින් - කි.ග්‍රෑ. 1,050.52	-	-	-
		ක්‍රිස්ටල් මෙතපිටමයින් (අයිස්) - කි.ග්‍රෑ. 2,982.82			
		කේරළ ගංජා - කි.ග්‍රෑ. 5,768.33			
		දේශීය ගංජා - කි.ග්‍රෑ. 257.043 - පැල 04			
		හෂිශ් - කි.ග්‍රෑ. 33.43			
		කොකෙන් - ග්‍රෑම් 732			
		කුෂ් - කි.ග්‍රෑ. 5.60			
		මෝදක - ගණනින් 5,054			
		මත්පෙති - ගණනින් 1,683,722			
		කසිප්පු - ලීටර් 160			
		ගෝඩා - ලීටර් 1920			
		අත්අඩංගුවට ගත් පුද්ගලයින් - 280			
නීති විරෝධී සංක්‍රමණයවීම් ක්‍රියාත්මක වීම වැළැක්වීම	නීති විරෝධී සංක්‍රමණිකයින් අත්අඩංගුවට ගැනීම	මුහුදේ දී අත්අඩංගුවට ගත් පුද්ගලයින් - 09	-	-	-
		ගොඩබිමෙන් අත්අඩංගුවට ගත් පුද්ගලයින් - 23			
		අත්අඩංගුවට ගත් යාත්‍රා - 06			
නීති විරෝධී වෙනත් ද්‍රව්‍යන් අත්අඩංගුවට ගැනීම	නීති විරෝධී වෙනත් ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීම් සහ සොයා ගැනීම	බීඩි කොළ - කි.ග්‍රෑ. 67,200.96	-	-	-
		දුම්වැටි - ගණනින් 420,385			
		මත්පැන් - බෝතල් 213			
		බියර් - කෑන් 09			
		කෘමි නාශක - බෝතල් 170,603			
		රත්‍රං - කි.ග්‍රෑ. 24.50			
		බීඩි - ගණනින් 29,120			
		ගජමුතු - ගණනින් 04			
		ඉඟුරු -කි.ග්‍රෑ. 7,186.70			
		එනසාල් - කි.ග්‍රෑ.1,778.42			
		කහ - කි.ග්‍රෑ. 2,623.00			
		හක් බෙල්ලෝ - ගණනින් 2,365			
		කජු - කි.ග්‍රෑ. 10.00			
		අම්බර් - ග්‍රෑම්. 465			
		වල් ඌරු මස් - කි.ග්‍රෑ. 18.80			
		කැස්බෑ මස් - කි.ග්‍රෑ. 199.364			
		ගෝණ මස් - කි.ග්‍රෑ. 218.00			
		දඩ මස් - කි.ග්‍රෑ. 199			
		මුව මස් - කි.ග්‍රෑ.08.00			
		මුහුදු කුඩැල්ලන් - ගණනින් 22,803			
		ජීවී කැස්බෑවන් - ගණනින් 02			
		පාවහන් - ගණනින් 843			
		ඖෂධ - ගණනින් 78,006			
		සතුන් - ගණනින් 634			
		ඇට වර්ග - පැකට් 2395 - කි.ග්‍රෑ. 203.15			
		කඩු - ගණනින් 04			
		වැලි - කියුබ් 01			
		අත්අඩංගුවට ගත් පුද්ගලයින් - 364			

විශේෂ යාත්‍රා බලසණ මෙහෙයුම්							
ඉලක්කය/ අරමුණ	ඉලක්කය	ජයග්‍රහණ දර්ශක			මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රතිශතය		
		සම්පූර්ණ මෙහෙයුම් සංඛ්‍යාව	අත්අඩංගුවට ගැනීම්	අත්අඩංගුවට නොගැනීම්	0% - 49%	50% - 74%	75% - 100
උතුරු නාවික විධානය							
ගොඩබිම් සහ මුහුදු මාර්ගයෙන් සිදු කරනු ලබන නීතිවිරෝධී මත්ද්‍රව්‍ය ජාවාරම්, නීතිවිරෝධී මසුන් ඇල්ලීම් සහ අනෙකුත් නීතිවිරෝධී ක්‍රියාකාරකම් මැඩ පැවැත්වීම	අත්අඩංගුවට ගැනීම සහ මැඩපැවැත්වීම	107	36	71	38.52%		
උතුරුමැද නාවික විධානය							
ගොඩබිම් සහ මුහුදු මාර්ගයෙන් සිදු කරනු ලබන නීතිවිරෝධී මත්ද්‍රව්‍ය ජාවාරම්, නීතිවිරෝධී මසුන් ඇල්ලීම් සහ අනෙකුත් නීතිවිරෝධී ක්‍රියාකාරකම් මැඩපැවැත්වීම	අත්අඩංගුවට ගැනීම සහ මැඩපැවැත්වීම	430	34	396	7.90%		
දකුණු නාවික විධානය							
ගොඩබිම් සහ මුහුදු මාර්ගයෙන් සිදු කරනු ලබන නීතිවිරෝධී මත්ද්‍රව්‍ය ජාවාරම්, නීතිවිරෝධී මසුන් ඇල්ලීම් සහ අනෙකුත් නීතිවිරෝධී ක්‍රියාකාරකම් මැඩ පැවැත්වීම	අත්අඩංගුවට ගැනීම සහ මැඩපැවැත්වීම	17	01	16	5.88%		
නැගෙනහිර නාවික විධානය							
ගොඩබිම් සහ මුහුදු මාර්ගයෙන් සිදු කරනු ලබන නීතිවිරෝධී මත්ද්‍රව්‍ය ජාවාරම්, නීතිවිරෝධී මසුන් ඇල්ලීම් සහ අනෙකුත් නීතිවිරෝධී ක්‍රියාකාරකම් මැඩ පැවැත්වීම	අත්අඩංගුවට ගැනීම සහ මැඩපැවැත්වීම	197	03	194	1.52%		
වයඹ නාවික විධානය							
ගොඩබිම් සහ මුහුදු මාර්ගයෙන් සිදු කරනු ලබන නීතිවිරෝධී මත්ද්‍රව්‍ය ජාවාරම්, නීතිවිරෝධී මසුන් ඇල්ලීම් සහ අනෙකුත් නීතිවිරෝධී ක්‍රියාකාරකම් මැඩ පැවැත්වීම	අත්අඩංගුවට ගැනීම සහ මැඩපැවැත්වීම	70	25	45	35.71%		
බටහිර නාවික විධානය							
ගොඩබිම් සහ මුහුදු මාර්ගයෙන් සිදු කරනු ලබන නීතිවිරෝධී මත්ද්‍රව්‍ය ජාවාරම්, නීතිවිරෝධී මසුන් ඇල්ලීම් සහ අනෙකුත් නීතිවිරෝධී ක්‍රියාකාරකම් මැඩ පැවැත්වීම	අත්අඩංගුවට ගැනීම සහ මැඩපැවැත්වීම	547	44	503	8.04%		

5.2 තිරසාර අරමුණු සඳහා ළඟාවීමට අදාළව නාවික හමුදාවේ විවිධ දෙපාර්තමේන්තු මඟින් විවිධ ක්‍රියාකාරකම්වල නියැලෙන නමුත් එම තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග ළඟා කරගන්නා ආකාරය සම්බන්ධයෙන් උක්ත ආකෘතිය පරිදි ප්‍රතිශතාත්මක ඇගයීමක් සිදු කිරීම ප්‍රායෝගිකව දුෂ්කරය.

06 පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

නාවික

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු
නිලධාරීන්	3768	3092	676
නාවිකයින්	49232	38525	10707

නාවික සිවිල්

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු
ජ්‍යෙෂ්ඨ	10	8	2
තෘතීයික	13	1	12
ද්විතීයික	145	80	65
ප්‍රාථමික	1707	1017	690

6.2 නාවික හමුදාවේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇති ආකාරය

නාවික හමුදා සේවක සංඛ්‍යාව වසර 2030 වන විට 40000ක් ලෙස පවත්වාගෙන යාමට කටයුතු කරගෙන යනු ලබන අතර, වර්ථමානය වන විට එය 41000ක සීමාව වෙත බලාපොරොත්තු වූ කාල සීමාවට ප්‍රථම ළඟාවී ඇත. විවිධ හේතු මත සේවයෙන් ඉවත්ව යන නාවිකයින් ප්‍රමාණය ඉහළ යාම, සේවා විශ්‍රාම ගැනීම හා අපේක්ෂිත බඳවා ගැනීමේ මට්ටම කරා ළඟා වීමේ අපහසුතා හේතුවෙන් මෙම තත්වය උද්ගත වී ඇත. මෙම තත්ත්වයට පිළියම් ලෙස නාවික හමුදාව විසින් නව බඳවා ගැනීම් සඳහා නාවික ඩිජිටල් මෙහෙයුම් හා සාම්ප්‍රදායිකව යොදාගන්නා ලද ක්‍රමවේදයන් ඔස්සේ සුදුසු අයදුම්කරුවන් නාවික හමුදාව වෙත ආකර්ශනය කර ගනිමින් නාවික හමුදාවේ කාර්ය මණ්ඩලය නිසි සීමාවේ පවත්වා ගැනීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
දේශීය පුහුණු (අභ්‍යන්තර)	9,344	2025 ජනවාරි මස 01 වන දින සිට 2025 දෙසැම්බර් 31 දක්වා	19,065,897.18	-	දේශීය	නාවික පුද්ගලයින්ගේ වෘත්තිය දැනුම සංවර්ධනය
දේශීය පුහුණු (බාහිර)	2,315		19,850,494.88	-	දේශීය	
විදේශීය පුහුණු	395		-	235,914,581.76	විදේශීය	
විභාග හා පරීක්ෂණයන්	75,381		1,396,140.00		දේශීය	

* ශ්‍රී ලංකා නාවික හමුදාවේ සියළුම නිලධාරීන් හා නාවිකයින් වෙත ව්‍යුහගත දේශීය සහ විදේශීය පුහුණු වැඩසටහන් මඟින් තමන් වෙත පැවරී ඇති රාජකාරීන් සහ වගකීම් කාර්යක්ෂමව ඉටු කිරීමට අවශ්‍ය වෘත්තීය නිපුණතාවය ලබා දීම.

07 පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ	-	-
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ	-	-
1.3	ව්‍යාපාර නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අනුකූල වේ	-	-
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	-	-	-
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	-	-	-
1.6	වෙනත්	-	-	-
2	**පොත්පත් හා ලේඛන (මු.රෙ 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
2.6	වෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N 20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා තිබීම	අනුකූල වේ	-	-
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ	-	-

3.3	සෑම ගනුදෙණුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ	-	-
3.4	2014.05.11 දිනැති 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිත කිරීමේ දී ගණකාධිකාරිවරයාගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ	-	-
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.4	වාර්ෂික ඇස්මේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ	-	-
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ 134(2) DMA/1-2019 අනුව වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ	-	-
6.3	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
6.4	මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 2ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ	-	-

8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරීයෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ	-	-
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ	-	-
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ 772 අනුව සිදු කිරීම	අනුකූල වේ	-	-
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල නොවේ	දැනට නාවික හමුදාව සතුව වාහන 4000ක ප්‍රමාණයන් තිබෙන අතර, එම වාහන දිවයින පුරා පිහිටි නාවික හමුදා කඳවුරු වෙත අනුයුක්ත කර ඇති අතර, මෙලෙස එම වාහනවල දෛනික ධාවන සටහන් සහ මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත යැවීම ප්‍රායෝගික නොවේ	වාහනවල දෛනික ධාවන සටහන් එම වාහන අදාළ ආයතනයේ පවත්වා ගනු ලබන බැවින් ද, මාසික සාරාංශ වාර්තා අදාළ ආයතනය වෙතින් මාසිකව නාවික හමුදා මූලස්ථානය වෙත ගෙන්වා ගනු ලබන බැවින් එම වාර්තා විගණන කටයුතු සඳහා විගණනය වෙත අවශ්‍ය වූ විට නාහමු වෙතින් ඉදිරිපත් කිරීමට යෝජනා කෙරේ

9.2	වාහන ගර්භිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල නොවේ	නාවික හමුදාවේ සීමිත වාහන සංඛ්‍යාවක් පවතින අතර, එක් වාහනයක් අපහරණය කිරීමේ දී එම වාහනය වෙනුවට අනුප්‍රාප්තික වාහනයක් ලබා දීම අත්‍යවශ්‍ය කරුණකි. එලෙස ලබා නොදීම තුළින් නාවික හමුදා කඳවුරු වෙත පවරා ඇති රාජකාරීන් ඉටු කිරීමේ දී දැඩි අපහසුතාවයන්ට ලක් වේ. තවද, රටෙහි පවතින ආනයනික සීමා හා ආර්ථික තත්ත්වය හේතුවෙන් නව වාහන මිලදී ගැනීමද ප්‍රායෝගික තත්වයක නොපවතී ඒ අනුව නාවික හමුදාව අත්‍යවශ්‍යම වාහන පමණක් අපහරණය කරනු ලබයි. කරුණු එසේ වෙතත් වාහන අලුත්වැඩියාව සඳහා ලබා දෙනු ලබන ප්‍රතිපාදන සීමා කිරීම, වාහන අලුත්වැඩියා කාලය ප්‍රමාද වීමට බලපාන ප්‍රධානම කරුණු බව නිරීක්ෂණය වේ	අපහරණය කරනු ලබන වාහන සඳහා අනුප්‍රාප්තික වාහන දීම වෙනුවෙන් නව වාහන මිලදී ගැනීමට සුදුසු ක්‍රමවේදයක් සැකසීමට යෝජනා කෙරේ. ඉහත පරිදි නව වාහන මිලදි ගැනීමට අපහසු වන්නේ නම් නාවික හමුදා වාහන අලුත්වැඩියා කිරීම වෙනුවෙන් ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් කිරීමට යේජනා කෙරේ
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ	-	-
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ	-	-
9.6	කල් බදු කාල සිමාවෙන් අනතුරුව බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම	අනුකූල වේ	-	-
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ	-	-
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ	-	-

11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ	-	-
11.2	මු.රෙ 94(1) ප්‍රකාරව සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ	-	-
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල වේ	-	-
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ	-	-
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කිරීම	අනුකූල නොවේ	වසර 15ට වඩා පැරණි හඳුනාගත නොහැකි ණය ශේෂ පැවතීම	වසර 15ට වඩා පැරණි හඳුනාගත නොහැකි ණය ශේෂය හැර වර්තාමානයේ හිඟ හිටි ණය ශේෂය නොමැත
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ 571 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ	-	-
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
14	**අග්‍රීම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ	-	-
14.2	මු.රෙ 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රීම එම කාර්යය අවසන්වී මාසයක් ඇතුළත නිරවුල් කිරීම	අනුකූල වේ	-	-
14.3	මු.රෙ 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රීම නිකුත් කර තිබීම	අනුකූල වේ	-	-
14.4	අග්‍රීම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ	-	-
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම	අනුකූල වේ	-	-
15.2	රැස් කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ	-	-

15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්යමණ්ඩල සීමාව තුළ කාර්යමණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයින් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ	-	-
16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා සෘජුවම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් නොකරන අතර, එම වාර්තා මාසිකව සහ ත්‍රෛයිමාසිකව ආරක්ෂක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබයි	-
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවි හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ	-	-
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ	-	-
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදන කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ	-	-

19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/ 2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල නොවේ	වාර්ෂිකව නාවික හමුදාවේ ඒ ඒ අංශයන් සඳහා පුද්ගලයින් බඳවා ගැනීමට අදාළව සැලසුම් සකස් කිරීම	-
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ	-	-
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ	නාවික හමුදාවේ පවතින රාජකාරි ස්වභාවය හා ක්‍රියා පටිපාටියට අනුව රාජකාරීන් හා වගකීම් පවරනු ලබන අතර, අවස්ථානුකූලව ඊට අදාළ ගිවිසුම්ගත වීම් සිදු කරනු ලබයි	-
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම	අනුකූල වේ	-	-
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ	-	-

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ඩීවීඑෆ්/බ/එස්බල්එස්/2025/02/08 මගේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2026 මැයි 29 දින

නාවික හමුදාධිපති
ශ්‍රී ලංකා නාවික හමුදාව

ශීර්ෂය 223 - ශ්‍රී ලංකා නාවික හමුදාවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩනය වාර්තාව

යටත්වන්න වාර්තාව මේ සමඟ එවා ඇත.

ගාන්. හේලිසේයගොඩ
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත් :- 1. අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය මිණුම් දෙපාර්තමේන්තුව
2. ලේකම් - ආරක්ෂක අමාත්‍යාංශය

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 98 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } DEF/B/SLN/2025/02/08 මගේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2026 මැයි 29 දින

නාවික හමුදාධිපති
ශ්‍රී ලංකා නාවික හමුදාව

ශීර්ෂය 223 - ශ්‍රී ලංකා නාවික හමුදාවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 223 - ශ්‍රී ලංකා නාවික හමුදාවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ශ්‍රී ලංකා නාවික හමුදාවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව ශ්‍රී ලංකා නාවික හමුදාවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව, ශ්‍රී ලංකා නාවික හමුදාව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව නාවික හමුදාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ආදායම් නොවන ලැබීම්

භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 11 දිනැති අංක TO/GR/Miscellaneous (iii) දරන ලිපිය ප්‍රකාරව, සමාලෝචිත වර්ෂයේ විදේශාධාර ගිණුම් නැවීම සම්බන්ධයෙන් 1994 අප්‍රේල් 20 දිනැති රාජ්‍ය ගිණුම් වක්‍රලේඛ අංක 30/94 ප්‍රකාරව කටයුතු කර ද්‍රව්‍ය හා උපකරණ වශයෙන් ලැබෙන විදේශාධාර මහා භාණ්ඩාගාරයේ විදේශ ප්‍රදාන ගිණුමට බැර කළ යුතුය. එසේම, 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 හි ඒසිඒ -7 ආකෘතියෙහි සඳහන් කරුණුවලට අමතරව , ආයතකින වශයෙන් ආවේණික ගනුදෙනු ඒසිඒ -7 තුළ ගැලපීම් කළ හැක. එසේ වුවද, සමාලෝචිත වර්ෂයේ ඕස්ට්‍රේලියානු රජයෙන් ප්‍රදානයක් ලෙස නාවික හමුදාවට ලද රු.1,232,523,227 ක් වූ ඉන්ධන හා ඇමරිකා එක්සත් ජනපදයේ ප්‍රදානයක් ලෙස ලද රු.2,700,000,000 ක් වූ නෞකාවේ නිශ්කාශන පිරිවැය ඇතුළු මුළු වටිනාකම් එකතුව රු.3,932,523,227ක් භාණ්ඩ/ද්‍රව්‍ය ලැබීම් ඉහත වක්‍රලේඛ හා මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු නොකර එකී වටිනාකම ආදායම් නොවන ලැබීම් ලෙස මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ සටහන් කිරීම හේතුවෙන් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ආදායම් නොවන ලැබීම් තුළ අන්තර්ගත භාණ්ඩාගාර අග්‍රිම වටිනාකම වූ රු.76,465,133,737 ක වටිනාකම සහ ඒ සඳහා යොමුව ලෙස දක්වනු ලබන අග්‍රිම ගිණුම (ACA -3) ආකෘතිය තුළ අන්තර්ගත භාණ්ඩාගාරයෙන් ලද අග්‍රිම හා 2025 ජනවාරි 01 දිනට නොපියවූ උප අග්‍රිම ශේෂයේ වටිනාකම යන දෙකෙහි එකතුව රු.72,532,610,510 ක් වූ වටිනාකම අතර රු.3,932,523,227 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.6.2 පුනරාවර්තන වියදම්

(අ) සමාලෝචිත වර්ෂයේ බැදීමට එළඹී සියළුම බැදීම් හා බැරකම් සටහන (iii) යටතේ දැක්විය යුතු වුවද 2026 වර්ෂයේ වවුවර් නියැදි පරීක්ෂාවේදී රු. 22,265,709 ක් වටිනා වවුවර් 03 ක් සඳහා ගෙවීම් කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි.

(ආ) අධ්‍යක්ෂ (මුදල්) ගේ 2026 අප්‍රේල් 27 දිනැති අංක එන්එච්කිව්/බීඑන්/එන්/සීරිපිටි/46/26 දරන ලිපිය ප්‍රකාරව නාවික හමුදාව විසින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට 2025 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිහ ශේෂ වටිනාකම රු. 479,660,646 ක් බව දක්වා තිබුණද, 2025 දෙසැම්බර් 31 දිනට බැරකම් ප්‍රකාශය තුළ රු.38,725,647 ක් ද, මුදල් රෙගුලාසි 94(2) සහ (3) ප්‍රකාරව බැරකම් වලට එළඹෙන ලද බැදීම් ප්‍රකාශය තුළ රු.435,977,932 ශේෂයක්ද ඇතුළත්ව තිබුණි. ඒ අනුව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ගෙවීමට ඇති නිවැරදි

වටිනාකම් සහ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් වටිනාකම් අතර රු. 4,957,066 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) නාවික හමුදා නිලධාරීන් සහ නාවිකයින් ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සේවය සඳහා අනුයුක්ත කරන අතර ඔවුන්ගේ වැටුප් හා වේතන නාවික හමුදාව විසින් ගෙවනු ලැබුවත් එම වටිනාකම නැවත නාවික හමුදාව වෙත ප්‍රතිපූර්ණය කිරීමක් වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව මගින් සිදු නොකෙරේ. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී ද ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවට අනුයුක්ත ශ්‍රී ලංකා නාවික හමුදා නිලධාරීන් සහ නාවිකයින් හට වැටුප් ලෙස ගෙවූ රු. 1,527,219,012 ක මුදල ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ වියදමක් ලෙස චාර්තා නොකට එය ශ්‍රී ලංකා නාවික හමුදාවේ වියදමක් ලෙස ගිණුම්ගත කිරීම තුළ සමාලෝචිත වර්ෂයේ නාවික හමුදාවේ සමස්ථ වියදම රු.1,527,219,012 ක් වැඩියෙන් දක්වා තිබුණි.

1.6.3 මූලධන වියදම්

2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 හි 7.8 ප්‍රකාරව, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් සඳහා මුදල් වැයකිරීම් යටතේ වන " මූලධන වත්කම් ඉදිකිරීම හෝ මිලදී ගැනීම හා වෙනත් ආයෝජන අත්පත් කරගැනීම් යටතේ ඇතුළත් කළ යුත්තේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඇතුළත් වත්කම් අත්පත් කර ගැනීමට දරන ලද වියදම් පමණි. එසේම එහි 7.9 ප්‍රකාරව ඉහත වියදම් හැර මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීමට අදාළ වියදම් මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දැක්විය යුතුය. ඊට අමතරව එහි 7.10 ප්‍රකාරව 2024 සඳහා වූ සන්සන්දනාත්මක සංඛ්‍යාද ඉහත 7.8 හා 7.9 ප්‍රකාරව දැක්විය යුතුය. එසේ වුවද, රු.2,005,684,171 ක් වූ මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීමට අදාළ වියදම් මාර්ගෝපදේශ ප්‍රකාරව මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ නොදක්වා ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දැක්වීම තුළ සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ අන්තර්ගත 2024 වර්ෂය සඳහා වූ සන්සන්දනාත්මක සංඛ්‍යාවල මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු. 2,005,684,171 ක් වැඩියෙන් ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

1.6.4 අත්තිකාරම් ගෙවීම්

රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ දෙපාර්තමේන්තු පාලන ගිණුමේ දක්වා ඇති ණය ශේෂය රු.743,963,663 වුවද කේවල ශේෂ වර්ගීකරණ සාරාංශය අනුව ණය ශේෂය රු.722,338,037 ක් වීමෙන් සමාලෝචිත වර්ෂය අවසාන දිනට එම ශේෂයන් අතර රු.21,625,625 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.6.5 ගබඩා අත්තිකාරම් ගිණුම

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර ඇති විකුණුම් ගිණුමෙහි 2025 ජනවාරි 01 සිට 2025 ජූනි 30 දක්වා දෛනිකව එක් එක් විකුණුම් ගණුදෙනුවේ වටිනාකම් ගිණුම්ගත කර තිබූ නමුත් 2025 ජූලි 01 සිට 2025 දෙසැම්බර් 31 දක්වා එක් එක් මාසයේ මුළු විකුණුම් වටිනාකම පමණක් විකුණුම් ගිණුමට බැර කර තිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂයේ දෙවන අර්ධ වර්ෂය තුල ගිණුම් තැබීමේ කාර්යය විධිමත්ව හා පැහැදිලිව පවත්වාගෙන යාමට අපොහොසත්ව තිබුණි.

1.6.6 මූල්‍ය නොවන වත්කම්

2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 හි 6 ප්‍රකාරව, මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනය සඳහා වූ ආදර්ශ ආකෘතිය වෙනුවට නව CIGAS වෙබ් යෙදුම මගින් ජනනය කරන SA 82 ආකෘතිය භාවිතා කළ හැකිය, 2025 දෙසැම්බර් 31 දිනට එම ආකෘතිය ප්‍රකාරව

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි ඇතුළත් විය යුතු දේපල, පිරියත හා උපකරණ වටිනාකම රු.70,342,641,966 ක් වුවද, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය තුළ නිරූපිත වටිනාකම රු.70,337,567,966 ක් වූයෙන් මූල්‍ය නොවන වත්කම් රු.5,074,000 ක් අඩුවෙන් දක්වා තිබුණි.

1.6.7 දේපළ පිරියත හා උපකරණ සංචිතය

2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 හි 7.11 මාර්ගෝපදේශය ප්‍රකාරව, දේපළ, පිරියත හා උපකරණවල අගයට සමාන වටිනාකමක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ශුද්ධ වත්කම්/ ස්කන්ධය යටතේ සංචිතයක් ලෙස දැක්විය යුතු නමුත් දේපල, පිරියත හා උපකරණ රු.5,074,000 ක් අඩුවෙන් මූල්‍ය නොවන වත්කම් යටතේ දැක්වීම තුළ ශුද්ධ වත්කම්/ස්කන්ධය යටතේ දේපළ, පිරියත හා උපකරණ සංචිත වටිනාකමද එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

(අ) සමාලෝචිත වර්ෂයේ වියදම් ඇස්තමේන්තු තුළ ඇතුළත් නොවූ පාඩු හා කපා හැරීම් (1701) වැය විෂයය සඳහා රු.152,000 ක් මුදල් රෙගුලාසි 66 මගින් මාරු කරගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ වාර්ෂික වියදම් ඇස්තමේන්තුව අනුව, වාහන වැය විෂය (223-1-1-23-2101-0/17) සඳහා රු.1,000,000,000 ක් ඇස්තමේන්තු කර තිබුණි. එම ප්‍රතිපාදනවලින් රු.640,000,000 ක් මුදල් රෙගුලාසි 66 යටතේ වෙනත් වැය විෂයයක් වෙත මාරු කර තිබුණු අතර ඉතිරි ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම වර්ෂය අවසානයේදී ඉතිරි වී තිබුණි.

3.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) මුදල් රෙගුලාසි 505	එකිනෙකට වෙනස් කාලාන්තර තෝරාගෙන සෑම මසකට වරක්වත් තොග සහ බඩු බාහිර විෂයයන් කිහිපයක් ඒවාට අදාළ තොග ලෙජර් ශේෂයන් සමඟ භෞතිකව සත්‍යාපනය කල යුතු අතර එහි ප්‍රතිඵල හා යම් කිසි විෂමතාවයක් ඇතොත් ඒ සම්බන්ධව අදාල මුදල් රෙගුලාසිය යටතේ කටයුතු කර ඇත්ද යන්න මුදල් රෙගුලාසි 504 හි සඳහන් ප්‍රකාශ ඉදිරිපත් කිරීමේදී

වාර්තා කල යුතු වුවත් එවැනි වාර්තා කාර්තු ප්‍රකාශන සමග විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 504 වෙළඳ අත්තිකාරම් ගිණුමක ප්‍රගතිය සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් එක් එක් කාර්තුව අවසානයේ කාර්තු වාර්තා පිළියෙල කොට එම කාර්තුවෙන් පසුව එලඹෙන ප්‍රථම මාසයේ 15 වැනිදාට පෙර විගණකාධිපති වෙත පිටපත් සහිතව ගණන් දීමේ නිලධාරියා වෙත ඉදිරිපත් කල යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාලව පළමු, තෙවන හා සිව්වන කාර්තු සඳහා කාර්තු වාර්තා විගණනයට ලබා දී නොතිබුණි.

3.3 තත්ත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම

2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි 9.1 ඡේදයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371 (2) (අ) ප්‍රකාරව , මාණ්ඩලික නිලධාරියෙකුගේ සෘජු අධීක්ෂණය යටතේ සේවය කරන ඕනෑම නිලධාරියෙකුට සුළු වියදම් සඳහා රු.25,000 ක උපරිමයක් දක්වා සුළු මුදල් අතුරු අග්‍රිමයක් තබාගැනීම සඳහා සිය අභිමතය මත අවසර දීමට ගණන් දීමේ නිලධාරියෙකුට හැකි වුවත් , අග්‍රිම ලේඛනයේ නිලධාරියාගේ නම සඳහන් නොකොට අදාළ අංශයේ නමින් අග්‍රිම අංක 01 සිට 54 දක්වා සුළු මුදල් නිකුත් කර තිබූ අවස්ථා 55 ක් නිරීක්ෂණය විය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

(අ) මූල්‍ය ප්‍රකාශන වලට අනුව සමාලෝචිත වර්ෂයේ අත්තිකාරම් ගිණුම් කටයුත්තේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.186,227,837 ක අතිරික්තයක් ලෙස පෙන්නුම් කල ද එය ඉකුත් වර්ෂයේ අතිරික්තයට සාපේක්ෂව රු.331,651,156 කින් එනම් සියයට 64 කින් අඩුවී තිබුණි. මේ සඳහා 2024 වර්ෂයට සාපේක්ෂව දළ ලාභ අනුපාතය සියයට 24 සිට සියයට 19.8 දක්වා පහත වැටීමත් තොග පිරිවැටුම් අනුපාතය දින 128 සිට 154 දක්වා දක්වා ඉහල යාමත් හේතු වී තිබුණි.

(ආ) 2025 මාර්තු 22 දිනැති අයවැය චක්‍රලේඛ අංක 01/2025 හි 02 ඡේදය ප්‍රකාරව, අයවැය මගින් ඉලක්කගත කාර්යයන් සහ ප්‍රතිඵල වර්ෂය තුළ සපුරාලීම ගණන්දීමේ නිලධාරීගේ මෙන්ම විෂය භාර නිලධාරීන්ගේද වගකීමක් වන අතර විශේෂයෙන් මූලධන සංවර්ධන ව්‍යාපෘති සහ සුභසාධන වැඩසටහන් යටතේ වෙන්කර ඇති ප්‍රතිපාදන පූර්ණ වශයෙන් උපයෝජනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වුවත් , සමාලෝචිත වර්ෂය අවසානයේ සුභසාධන වැඩසටහන් සඳහා ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් ඉතිරිය සියයට 77 ක් ද, මූලධන වත්කම් අත්පත් කරගැනීම , පුනරුත්ථාපනය හා වැඩිදියණු කිරීම සඳහා වූ වැය විෂයයන්ගේ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් ඉතිරිය සියයට 12 සිට සියයට 89 දක්වා පරාසයක පැවතුණි.

4.2 ප්‍රසම්පාදනයන්

(අ) විජේරාමේ පිහිටි නිල නිවසක් ඉදිකිරීමේ ව්‍යාපෘතියට අදාලව විශේෂ ව්‍යාපෘති සහ ගොඩනැගිලි ඉදිකිරීම් යටතේ සිදු කරන ලද ප්‍රසම්පාදන 32 කට අදාලව ප්‍රසම්පාදන ලිපිගොණු පරීක්ෂාවෙදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 අනුව සියළුම ආශ්‍රිත වියදම් ඇතුළුව මුළු පිරිවැය ඇස්තමේන්තුවක් ප්‍රසම්පාදන අස්ථිතිය විසින් පිළියෙල කළ යුතුය. නමුත් විගණනය සඳහා ඉදිරිපත් කර තිබූ ප්‍රසම්පාදන ලිපිගොණු 32 න් ලිපිගොණු 27 ක පිළියෙල කල ඇස්තමේන්තු නිසි පරිදි ඇතුළත් නොවූ අතර ප්‍රසම්පාදන අභියාචනා පත්වල (Procurement request form) ඇස්තමේන්තු වටිනාකම් ඇතුලත් වුවත් මාර්ගෝපදේශ සංග්‍රහයේ දක්වා ඇති පරිදි හදිසි අවිනිශ්චිත ප්‍රතිපාදන වෙන් කිරීම් ආදිය ඇතුලත් කල විධිමත් ඇස්තමේන්තු පිළියෙල කිරීම් නොතිබුණි.

(ii) කොන්ත්‍රාත් වටිනාකම රු 500,000 ඉක්මවන්නේ නම් දෙපාර්ශවය ගිවිසුමකට එළඹිය යුතු බවට වන කොන්දේසියක් ලංසු කැඳවීමේ ලේඛනවල ඇතුලත් වුවත් ප්‍රසම්පාදනයන්ට අදාළ වටිනාකම ලක්ෂ 05 ඉක්මවූ එනම් එකතුව රු.3,383,183 ක් වූ ලංසු කැඳවීම් 04 කට අදාලව එවැනි ගිවිසුම්වලට ඇතුළත්ව නොතිබුණි.

(ආ) සීමිත ජාතික තරගකාරී ලංසු ක්‍රමය යටතේ නාවික හමුදාවේ නිළධාරීන්ට Material Cloth Bed Sheet Light Blue රෙදි මීටර් 82,500 ක් මිලදී ගැනීමට 2023 ජනවාරි 18 දින ලංසු කැඳවා තිබූ අතර රු.94,875,000 ක සමස්ථ කොන්ත්‍රාත් වටිනාකමක් යටතේ සැපයුම්කරු තෝරාගෙන තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6.1 ට අනුව පිරිවිතර සමාලෝචනය හා අනුමත කිරීම, පිළිගත් ප්‍රසම්පාදන මූලධර්ම වලට අනුකූලව ක්‍රියාකරන බවට සහතික වීම පිණිස ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් පිළියෙළ කරන ලද පූර්ව සුදුසුකම් පරීක්ෂා කිරීම, ලංසු කැඳවීමේ ලේඛන සමාලෝචනය කර අනුමත කිරීම, අවශ්‍ය අවස්ථා වලදී ලංසු කැඳවීමේ ලේඛනවලට ඌණ පූර්ණ අනුමත කර නිකුත් කිරීම ආදී කාර්යයන් සම්බන්ධ තාක්ෂණික ඇගයීම් කමිටුවේ සාමාජිකයින් සාමූහිකවත් තනි තනිවත් වගකිව යුතු නමුත් තාක්ෂණික ඇගයීම් කමිටුව පත්කර තිබුණේ ලංසු ලේඛන විවෘත කර මාස 2 කුත් දින 22 ක් ගත වූ පසුව 2023 මැයි 15 දින බැවින් වගකීම් දැරීමේ හැකියාව තාක්ෂණික ඇගයීම් කමිටුවට නොතිබුණි.

(ඇ) ජාතික තරගකාරී ලංසු ක්‍රමය යටතේ නාවික හමුදාවට අවශ්‍ය නිල ඇදුම් මැසීමට සඳහා යොදාගන්නා Material cloth Light Blue හා Material cloth Dark Blue නමැති රෙදි මීටර් 80,000 බැගින් මිලදී ගැනීම සඳහා ලංසු කැඳවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6.1 වගන්තිය ප්‍රකාරව පිරිවිතර ස්වභාවයෙන් උත්පාදන බවටත්, සමාන මට්ටමකින් තරහකාරී බව ප්‍රවර්ධනය කල හැකි බවටත් සහතික වීම පිණිස පිරිවිතර සමාලෝචනය කිරීම සහ අනුමත කිරීම, පිළිගත් ප්‍රසම්පාදන මූලධර්ම වලට අනුකූලව ක්‍රියාකරන බවට සහතික වීම පිණිස ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් පිළියෙල කරන ලද පූර්ව සුදුසුකම් පරීක්ෂා කිරීමේ ලේඛණ/ ලංසු කැඳවීමේ ලේඛණ සමාලෝචනය කොට අනුමත කිරීම, අවශ්‍ය අවස්ථාවන්හිද ලංසු කැඳවීමේ ලේඛණවලට ඌණපූර්ණ අනුමත කර නිකුත් කිරීම ආදී කාර්යයන් සම්බන්ධයෙන් තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයන් සාමූහිකවත් තනි තනිවත් වගකිව යුතු නමුත් මෙම ප්‍රසම්පාදනයන් සම්බන්ධව තාක්ෂණික ඇගයීම් කමිටු පත් කර තිබුණේ ලංසු කැඳවීමේ ලේඛණ විවෘත කිරීමෙන් පසුව දින 26 ක් ගත වූ පසුව බැවින් වගකීම් දැරීමේ හැකියාවක් එකී කමිටුවට නොතිබුණි.

(ii) පළමු කොන්ත්‍රාත්කරු කොන්ත්‍රාත්තුව භාර ගැනීම ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් දෙවනුවට සාරනුකූලව ප්‍රතිචාර දන්වා තිබූ සැපයුම්කරු වෙත ඒකකයක් 520 බැගින් කොන්ත්‍රාත්තු දෙකම රු. 83,200,000 කට ප්‍රධානය කිරීමට තාක්ෂණික ඇගයීම් කමිටුව නිර්දේශ කර තිබූ නමුත් පිරිවිතර වෙනස් කිරීමේ අවශ්‍යතාවයක් මත අදාල කොන්ත්‍රාත්තුව පිරි නැමීම නවතා තිබුණි. පැරණි පිරිවිතරය වෙනස් කල යුතු බවට සාධාරණ හේතූන් ඉදිරිපත් වී නොමැති තත්ත්වයක් තුල කඩිනමින් නව පිරිවිතර හඳුන්වාදීමේ අවශ්‍යතාවය මතුවීම හා තෝරාගත් සැපයුම්කරු වෙත කොන්ත්‍රාත්තු දෙක

ප්‍රධානය නොකොට නව පිරිවිතරය යටතේ නැවත ලංසු කැඳවීමට තීරණය කිරීම ගැටළු සහගත විය. එමෙන්ම පළමු අවස්ථාවේ ප්‍රසම්පාදනය ජාතික තරගකාරී ලන්සු කැඳවීම යටතේ සිදුකර තිබූ නමුත් එය නතරකර පිරිවිතරය වෙනස්කර නැවත ප්‍රසම්පාදනය සිදු කරන විට සාධාරණ හේතු දැක්වීමකින් තොරව සීමිත තරගකාරී ලංසු කැඳවීමට කටයුතු කර තිබුණි.

(iii) ඉහත ප්‍රසම්පාදන සඳහා ප්‍රතිචාර දක්වා තිබූ එකම ලංසුකරු රෙදි මීටරයක් සඳහා රු.1,622 බැගින් රෙදි මීටර් 50,000 ක් බැගින් සැපයුම් දෙක සඳහා රු.162,200,000 කට සැපයුම්කරු තෝරාගෙන තිබුණි. මෙම මිළ ගණන් ඉදිරිපත් කිරීමට මාස 05 කට පෙර එනම් 2021 දෙසැම්බර් 27 දින මෙම කොන්ත්‍රාත්තුව සඳහා රෙදි මීටරයක මිළ රු.641 වූ අතර මාස 05 කට පසු රෙදි මීටරයක වටිනාකම රු.641 සිට රු.1,622 දක්වා සියයට 153 කින් වර්ධනය වී තිබූ අතර ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් සැපයුම්කරු සමග සාකච්ඡා කර මිළ අඩුකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

(iv) 2024 මාර්තු 20 වන කළමණාකරන මණ්ඩල හා අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේදී ලබාගත් තීරණයකට අනුව මෙම නව පිරිවිතරයේ රෙදිවල ගුණාත්මකභාවය අඩු බැවින් පවතින තොග අවසන් වීමෙන් පසු නැවත පැරණි පිරිවිතරය යටතේ රෙදි මිළදී ගැනීමට තීරණය කිරීම තුළ නව පිරිවිතරය යටතේ නිමකල නිමි ඇඳුම්වල ගුණාත්මකභාවය අඩු බව නිරීක්ෂණය විය. පැරණි පිරිවිතරය යටතේ ක්‍රියාත්මක වූ CB/A/29/2020 හා CB/A/30/2020 ප්‍රසම්පාදනය යටතේ තෝරාගත් සැපයුම්කරු වෙත ප්‍රසම්පාදනය ලබා නොදී ප්‍රසම්පාදනය අවලංගු කර නව පිරිවිතරය යටතේ CB/A/128/2021 හා CB/A/129/2021 ප්‍රසම්පාදනයන් ක්‍රියාත්මක කර තෝරාගත් සැපයුම්කරු වෙත ප්‍රසම්පාදනය පිරිනැමීම තුළ ගුණත්වයෙන් අඩු රෙදි මිළදී ගැනීම සඳහා රු.221,800,000 වැය කිරීම තුළ ප්‍රසම්පාදන අස්ථිත්වය වෙත රු.149,000,000 ක අලාභයක් සිදු වී තිබුණි.

4.3 වත්කම් කළමනාකරණය

වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවට අයත් හෙක්ටයාර් 0.1011 පමණ වූ ශ්‍රීලංනාතෙන බුවනෙක ආයතනය යටතේ පවතින චලෙයිපාඩු දකුණ 02 පිහිටි ඉඩම සහ හෙක්ටයාර් 0.1011 පමණ වූ ඉරණතිව් දකුණ 01 ඉඩම යන ඉඩම් පිළිවෙලින් 2020 හා 2024 වර්ෂවල සිට නාවික හමුදාව වෙත පවරා ගැනීම සඳහා කටයුතු කරමින් පැවතියද 2026 මාර්තු 15 දින වන විටත් පවරා ගැනීමේ කටයුතු අවසන්ව නොතිබුණි.

4.4 කළමනාකරණ දුර්වලතා

(අ) මිය ගිය සේවකයන් 06 දෙනෙකුගෙන් අවුරුදු 01 ත් 20 ත් අතර කාලයක සිට රු. 587,835 ක් ද විශ්‍රාම ගිය සේවකයින් 12 දෙනෙකුගෙන් අවුරුදු 01 ත් 05 ත් අතර කාලයක සිට රු. 1,760,050 ක් සහ විශ්‍රාම ගිය සේවකයින් 03 දෙනෙකුගෙන් අවුරුදු 05 ත් 10 ත් අතර කාලයක සිට රු. 368,213 ක් ද වැඩ තහනම් කළ සේවකයින් 03 දෙනෙකුගෙන් රු. 414,149.35 ක් ද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කේවල ශේෂ වර්ගීකරණ සාරාංශය අනුව සේවය හැර ගිය සේවකයින් 31 දෙනෙකු ගෙන් අවුරුදු 01 ත් 05 ත් අතර කාලයක සිට රු.5,006,551 ක මුදලක්, සේවකයින් 08 දෙනෙකුගෙන් අවුරුදු 05 ත් 10 ත් අතර කාලයක සිට රු.818,271 ක මුදලක් සහ එක් සේවකයෙකුගෙන් අවුරුදු 10ට වැඩි කාලයක සිට රු.42,300 ක මුදලක් වශයෙන් සේවකයන් 40 දෙනෙකු ගෙන් අයවිය යුතු සේවක ණය ශේෂ රු. 5,867,123 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගෙන නොතිබුණි.

(ඇ) 2025 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා අත්තිකාරම් බී ගිණුමේ කේවල ශේෂ වර්ගීකරණ සාරාංශය අනුව ණය වයස් විශ්ලේෂණය වර්ෂ 10 ත් 20 ත් අතර වන වෙනත් නාවික පුද්ගලයන් 41 දෙනෙකුගෙන් රු.6,670,603 ක් ද, මිය ගිය එක් අයකුගෙන් රු.104,884 ක් ද,සේවය හැර ගිය එක් සේවකයකුගෙන් රු.42,300 ක් ද වශයෙන් මුළු සේවකයන් 43 දෙනෙකුගෙන් රු.6,817,787 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයවී නොතිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

5.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

(අ) ජ්‍යෙෂ්ඨ හා තෘතියික මට්ටමේ නාවික හමුදා කාර්යය මණ්ඩලය ලෙස 55,000 ක කාර්යය මණ්ඩලයක් අනුමතකර තිබුණද 2025 දෙසැම්බර් 31 දිනට තත්‍ය සංඛ්‍යාව 41,548 ක් වූ අතර ජ්‍යෙෂ්ඨ හා තෘතියික මට්ටමේ පුරප්පාඩු 13,406 ක් පැවතුණි. එය අනුමත සමස්ථ සේවක සංඛ්‍යාවෙන් සියයට 24.4 ක පමණ ප්‍රතිශතයක් විය. ඒ තුල පුරප්පාඩු ජ්‍යෙෂ්ඨ නාවික පුද්ගලයන් සංඛ්‍යාව 668 ක් වූ අතර එය අනුමත සංඛ්‍යාවෙන් සියයට 18 ක් පමණ විය. තෘතියික මට්ටමේ පුරප්පාඩු සංඛ්‍යාව 12,738 පමණ වූ බැවින් එය අනුමත සංඛ්‍යාවෙන් සියයට 25 ක් පමණ විය. මෙලෙස පුරප්පාඩු පැවතීම ඉහල කාර්යසාධනයක් ලහාකර ගැනීමට බාධාවක් වී තිබුණි.

(ආ) නාවික හමුදාවට අදාලව ජ්‍යෙෂ්ඨ, තෘතියික, ද්විතියික, ප්‍රාථමික මට්ටමේ සිවිල් සේවක පුද්ගලයන් 1875 ක් අනුමත කර තිබුණද 2025 දෙසැම්බර් 31 දිනට තත්‍ය සේවක සංඛ්‍යාව 1,106 ක් වූ බැවින් 769 ක් හෙවත් සියයට 41 ක් පුරප්පාඩුව පැවතුණි. ජ්‍යෙෂ්ඨ, තෘතියික,ද්විතීයික හා ප්‍රාථමික මට්ටම්වල පුරප්පාඩු ප්‍රතිශතයන් පිළිවෙලින් සියයට 20,92,45 හා 40 බැගින් පැවතීම මත සිවිල් රාජකාරී ඉටු කිරීමේදී ගැටළු මතුවී තිබුණි. එමෙන්ම පසුගිය වසර 04 ක කාලය තුල ප්‍රාථමික මට්ටමේ සේවය කල සිවිල් සේවකයින් 146 ක් විශ්‍රාම ගොස් තිබූ අතර 56 ක් සේවය අතහැර ගොස් තිබුණි. එම කාලය තුළ පුද්ගලයන් 202 ක් සේවයෙන් ඉවත්ව ගොස් තිබූ නමුත් ඒ සඳහා කිසිදු සේවකයෙකු අළුතින් බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2018 හා 2019 වර්ෂවල මුදල් රෙගුලාසි 95 යටතේ සේවයට බඳවාගන්නා ලද සේවකයන් 10 දෙනෙකු මාසයකට වරක් සේවය බණ්ඩනය කරමින් 2025 දෙසැම්බර් 31 දින දක්වා සේවයේ යොදාගෙන තිබූ අතර සිවිල් කාර්ය මණ්ඩලය තුල සේවකයන් 769 ක පුරප්පාඩු පැවතියද මෙකී සේවකයන් වසර 6 කට වැඩි කාලයක සිට ස්ථිර නොකොට දෛනික වැටුප් පදනම මත සේවයේ යොදවාගෙන තිබුණි.

කේ.කේ.ඩබ්ලිව්.ජයකොඩි
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට